

# ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

## වාර්ෂික වාර්තාව 2019

# “ තාර්කිකත්වය

ශ්‍රී ලංකාව ඉන්දියානු සාගරයේ කුඩාම කුඩා තිතක් පමණක් වුවත්,  එය මෙම විස්මිත දූපත දෙස ඉහළ අහසේ සිට බලන ඕනෑම අයකු තුළ හැඟුම් දැනවීමට ප්‍රමාණවත් ය. ඉහළ සිට පෙනෙන ශ්‍රී ලංකාව ඔබව මවිතයට පත්කරනු ඇති බවටත්, එය ශ්‍රී ලංකාව නැමති දූපත බවට පත් කරලීමට ඉවහල් වූ හේතු සාධක සෙවීමට ඔබව පොළඹවාලනු ඇති බවටත් සැකයක් නැත. ”

# ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

## වාර්ෂික වාර්තාව 2019

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය





## පටුන


| | |
|---|---|
| 01. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ කාර්යභාරය | 4 |
| 02. දැක්ම | 5 |
| 03. මෙහෙවර | 6 |
| 04. අභිමතාර්ථ | 7 |
| 05. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ මාර්ගෝපදේශ | 8 |
| 06. අමාත්‍යවරයාගේ පණිවිඩය | 9 |
| 07. සංචාරක අමාත්‍යංශයේ ලේකම්වරයාගේ පණිවිඩය | 10 |
| 08. සභාපතිතුමියගේ පණිවිඩය | 11 |
| 09. අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින් | 12 |
| 10. අධ්‍යක්ෂ මණ්ඩලය | 17 |
| 11. කර්මාන්ත කාර්ය සාධනය පිළිබඳ දළ විශ්ලේෂණය | 24 |
| ගෝලීය සංචාරක ක්ෂේත්‍රය පිළිබඳ දළ විශ්ලේෂණය | 24 |
| ශ්‍රී ලංකාවේ සංචාරක දළ විශ්ලේෂණය | 25 |
| 12. පාස්කු ඉරිදා ත්‍රස්ත ප්‍රහාරය - පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් පසුව ශ්‍රී ලංකාවට ජාත්‍යන්තර ප්‍රජා සහයෝගය | 27 |
| 13. වසරක කාලයක් තුළ ඉටුකරගත් දෑ | 32 |
| ආයෝජකයින් සමග සම්බන්ධතාවය | 32 |
| යටිතල පහසුකම් සංවර්ධනය | 37 |
| තත්ත්ව නඩත්තුව | 44 |
| ප්‍රවර්ධනයන් | 49 |
| දැනුවත් කිරීමේ පුහුණුව | 52 |
| දේශීය සංචාරක හා ප්‍රජා සම්බන්ධතා | 53 |
| නිකේතන කළමනාකරණය | 55 |
| මෙහෙයුම් සහ උපකාරක සේවා | 58 |
| 14. ආයතනික තොරතුරු | 63 |
| 15. මූල්‍යමය උද්දීපනයන් | 64 |
| 16. වාර්ෂික ගිණුම් | |
| මූල්‍ය තත්ව ප්‍රකාශය | 66 |
| මූල්‍ය කාර්‍යසාධන ප්‍රකාශය | 67 |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 68 |
| හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය | 69 |
| මූල්‍ය ප්‍රකාශන වලට සටහන | 71 |
| නිකේතන මෙහෙයුම් සාරාංශය | 88 |
| ආදායම් හා වියදම් වලට අදාල අයවැය සහ තත්‍ය සංසන්දනය | 95 |
| 17. විගණන වාර්තා | 98 |
| 18. ශ්‍රී ලංකාවේ සිතියම | 105 |

## ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය යනු



# “දැක්ම

ශ්‍රී ලංකාව වඩාත්ම විශේෂිත සහ විවිධාකාර අත්දැකීම්වලින් හෙබි මතකයේ රඳන අනර්ඝතම දූපත වශයෙන් ලෝකයේ පිළිගැනීමට පාත්‍ර කරලීම.”



# “මෙහෙවර

රටෙහි ස්වාභාවික හා සංස්කෘතික උරුමයන්, පාරිසරික වගකීම් හා සමාජීය සම්බන්ධතා ආදිය ලොවට පිළිබිඹු කරමින් අතිවිශිෂ්ට අත්දැකීම් පිරිනමන, ලෝක සංචාරක ක්ෂේත්‍රයේ ඉහළම අගයක් සහිත ගමනාන්තයක් බවට පත් කර රටට හා ප්‍රජාවට ආර්ථික ප්‍රතිලාභ සැලසීම මෙහෙවරයි. ”



## අභිමතාර්ථ

2005 අංක 38 දරන සංචාරක පනත ප්‍රකාරව ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ අභිමතාර්ථ.

a) දේශීය හා ජාත්‍යන්තර වශයෙන් ශ්‍රී ලංකාව සංචාරක ගමනාන්තයක් බවට පත්කිරීම.

b) සංචාරක ව්‍යාපාරයට අදාළව අමාත්‍ය මණ්ඩලය සකස් කරන ප්‍රතිපත්ති රාමුවට අනුව සංචාරක ව්‍යාපාරය සහ ඊට සම්බන්ධ කටයුතුවලට අදාළව විෂයභාර අමාත්‍යවරයාට උපදෙස් දීම.

c) දේශීය සහ ජාත්‍යන්තරව ශ්‍රී ලංකාව සංචාරක ගමනාන්තයක් වශයෙන් සංවර්ධනය, ප්‍රවර්ධනය සහ අලෙවිකිරීම සඳහා ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධනය කාර්යාංශයට උපදෙස් ලබාදීම.

d) ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනය මගින් ක්‍රියාත්මක කරන මානව සම්පත් පුහුණුකිරීම් සහ ප්‍රවර්ධන කටයුතු සඳහා මග පෙන්වීම ලබාදීම.

e) ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය සඳහා දක්වන දායකත්වය තවදුරටත් පවත්වා ගැනීම සඳහා සංචාරක අංශය වැඩිදියුණු කිරීමට කටයුතු කිරීම.

f) නිවාඩු නිකේතන තිරසාර ලෙස පවත්වා ගැනීම ඇතුළු ප්‍රමාණවත්, ආකර්ශණීය සහ කාර්යක්ෂම සංචාරක සේවාවක් සංවර්ධනය හා ප්‍රවර්ධනය කිරීම.

g) සංචාරක කර්මාන්තය සහ අනිකුත් අදාළ අංශයන් දේශීය සහ ජාත්‍යන්තරව පිළිගත් තත්ත්වයන්ට අනුකූලව පිහිටුවීම සහ පවත්වා ගැනීම තහවුරු කිරීම සඳහා බලපත්‍ර ලබා දීම සහ සුපරීක්ෂාව.

h) සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සහ ඒ ආශ්‍රිත පුද්ගලයින්ගේ ප්‍රවර්ධන සහ පුහුණු කටයුතු සඳහා පෞද්ගලික අංශයේ සහභාගීත්වය දිරිමත් කිරීම.

i) උක්ත අභිමතාර්ථ සාක්ෂාත් කරගැනීම සඳහා අවශ්‍යවන අනිකුත් සියලුම කටයුතු සැලසීම.

## ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ මාර්ගෝපදේශ

01. සංචාරක කර්මාන්තයේ ප්‍රතිලාභ ශ්‍රී ලංකාව වෙත ළඟා කර ගැනීම.

ශ්‍රී ලංකාවේ ආර්ථිකය වර්ධනය සහ විවිධාංගීකරණය සඳහා සංචාරක කර්මාන්තය මගින් සැලකිය යුතු දායකත්වයක් සැලසේ. සංචාරක ක්ෂේත්‍රය, ආර්ථිකයෙහි ප්‍රධාන අංගයක් වශයෙන් මෙන්ම රාජ්‍ය තීරණ ගැනීමේ ක්‍රියාවලියේදී ප්‍රමුඛතාවය ලැබිය යුතු ක්ෂේත්‍රයක්ද වේ. රාජ්‍ය අංශයේ පහසුකම් සැලසීම යටතේ පෞද්ගලික අංශය සංචාරක කර්මාන්තය සංවර්ධනය සඳහා ප්‍රධාන කාර්යභාරයක් ඉටුකළ යුතුයි.

02. සෑම අයකුටම ආර්ථිකයට දායක වීමට හැකි වීම.

විදේශ විනිමය ඉපයීම ඉහළ නැංවීම, සංවර්ධනය, දිවයින පුරාව්‍යාප්ත කිරීම සහ ශ්‍රී ලාංකිකයන්ට ඵලදායි රැකියා අවස්ථා ඇති කිරීම මගින් සංචාරක කර්මාන්තය ශ්‍රී ලංකාවේ ආර්ථිකයට ප්‍රශස්ත මට්ටමින් දායක විය යුතුය. තවද සියලුම පාර්ශව කරුවන්ට සමාජ ආර්ථික ප්‍රතිලාභ සමසේ බෙදී යන අයුරින් සංචාරක අංශයේ වර්ධනය, වටිනාකම් දාමය උද්දීපනය සහ ශක්තිමත් කිරීම මෙන්ම ඵලදායි දීර්ඝකාලීන ආර්ථික ක්‍රියාමාර්ග ඇතිකිරීම තහවුරු කළ යුතුය.

03. වත්කම් සංරක්ෂණය සහ ජාත්‍යන්තර මට්ටමේ කළමනාකරණය.

සංචාරක ක්ෂේත්‍රය හැමවිටම සිදුවිය හැකි හානිකර බලපෑම් මග හරවා ගනිමින්, ස්වාභාවික පරිසරය සහ එහි ඓතිහාසික, සාමාජීය සහ සංස්කෘතික දයාද වැඩි දියුණු කිරීමට කටයුතු කළ යුතුයි. තවද අත්‍යවශ්‍ය පාරිසරික ක්‍රියාවලි පවත්වා ගනිමින් සහ ස්වාභාවික ජෛව විවිධත්වය ආරක්ෂා කරගැනීමට කටයුතු කරමින් ස්වාභාවික සම්පත් ප්‍රශස්ත අයුරින් භාවිත කිරීමට මෙම කර්මාන්තය කටයුතු කළ යුතුය.

04. දේශීය ප්‍රජා සහභාගීත්වය

සංචාරක කර්මාන්තය සත්කාරක ප්‍රජාවේ සමාජ සංස්කෘතික අනන්‍යතාවයට ගරු කළ යුතු වන අතර ඔවුන් ගොඩනගන ලද සහ ජීවමානව පවත්වා ගෙනයන සංස්කෘතික උරුමයන් සහ පාරම්පරික වටිනාකම් සංරක්ෂණය කළ යුතුය. තවද ඔවුන්ගේ අන්තර් සංස්කෘතික අවබෝධය සහ දරාගැනීමේ හැකියාව තවදුරටත් පෝෂණය කළ යුතුය. සංචාරක ක්ෂේත්‍රයේ සංවර්ධනය ප්‍රාදේශීය ජන සමාජ යථාර්ථවාදී සහ පුළුල් පරාසයකින් සම්බන්ධ කරගත යුතුය. කලාපීය සහ ප්‍රාදේශීය ප්‍රබල දේශපාලන නායකත්වයෙන් අදාළ පාර්ශව කරුවන්ගේ පුළුල් සහභාගීත්වය ලබාගැනීම, දිරිගැන්වීම හා එකඟතා ඇතිකර ගැනීමට සහය දීම සිදුකළ යුතුය.

05. උරුමය තුළ මුල් බැස ඇති අමතක නොවන අත්දැකීම්

සියලුම සංචාරක සේවා සහ ක්‍රියාකාරකම් සංචාරකයා පාදක කරමින් සිදුකළ යුතු අතර එම ක්‍රියාකාරකම්, ශ්‍රී ලංකාවේ පාරිසරික, ආගමික, සමාජීය සහ සංස්කෘතික උරුමය තුළ මුල් බැස තිබිය යුතුය. සංචාරක සේවා සහ ක්‍රියාකාරකම් මගින් සංචාරකයාට ඉහළ තෘප්තියක් සැපයිය යුතු අතර, ඉගෙන ගැනීමේ අවස්ථාවන් ලබාදෙමින් සහ යහපත් සංචාරක කටයුතු පිළිබඳ අවබෝධය ඇතිකිරීමට කටයුතු කරමින්, අර්ථවත් අත්දැකීම් ලබා දීම තහවුරු කළ යුතුය.

06. ශ්‍රී ලංකාව ඉහළම වටිනාකමින් යුතු ගමනාන්තයක් ලෙස ලෝක සංචාරක ක්ෂේත්‍රය තුළ අලෙවි කිරීම.

ශ්‍රී ලංකාවේ සුවිශේෂ පරිසරය, සම්ප්‍රදායන් සහ ආකර්ෂණීය ස්ථාන ඉස්මතු කරමින් සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකාව, ලොව ඉහළම වටිනාකමින් යුත් ගමනාන්තයක් ලෙස ඉතා වගකීමෙන් යුතුව අලෙවිකරණය කළ යුතුය. තවද ශ්‍රී ලංකාව සහ සංචාරක කර්මාන්තය පිළිබඳ කාලයක් තිස්සේ පවතින දුර්මත පහ කිරීමට ද කටයුතු කළ යුතුය.

07. සියලු දෙනාට ආරක්ෂාව සහ පරිස්සම.

සියලුම සංචාරකයන්, ආයෝජකයින්, ප්‍රජාව සහ සතුන් සඳහා ආරක්ෂාව මෙන්ම සුරක්ෂිත වටපිටාවක් තහවුරු කළ යුතුය.

## අමාත්‍යවරයාගේ පණිවිඩය

සංචාරක අමාත්‍යාංශය වශයෙන්, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ 2019 වාර්ෂික වාර්තාවට මෙම පණිවිඩය නිකුත් කිරීමට ලැබීම සතුටට කරුණකි.

සංචාරක ව්‍යාපාරය යනු ශ්‍රී ලංකාවේ අතිශය තීරණාත්මක කර්මාන්තයක් වන අතර එය ආර්ථික දෘෂ්ටි කෝණයකින් පමණක් නොව සමාජ-දේශපාලන දෘෂ්ටිකෝණයෙන් ද වැදගත් වේ. එය රැකියා උත්පාදනය, දරිද්‍රතාවය පිටුදැකීම සහ යටිතල පහසුකම් සහ රාජ්‍ය සේවා සංවර්ධනය සඳහා වූ ගාමක බලවේගයක් ලෙස සේවය කරයි. ඒ අනුව සංචාරක කර්මාන්තය ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනයට ප්‍රධාන පහසුකම් සපයන්නෙකු ලෙස සැලකිය හැකිය.

මේ අනුව බලන කල, ශ්‍රී ලංකාව ජාත්‍යන්තර ප්‍රජාව විසින් සම්මාන කිහිපයක් සමඟ පිළිගැනීම තුළින් රටේ සංචාරක අංශය නිවැරදි දිශානතියෙන් ඉදිරියට යන බව සනාථ වේ. නිදසුනක් වශයෙන්, 2019 වර්ෂයේ දී ශ්‍රී ලංකාව ලෝකයේ අංක එකේ සංචාරක ගමනාන්තය වශයෙන් ලෝන්ලි ප්ලැනට් (Lonely Planet) මඟින් පිළිගනු ලැබීම සංචාරක කර්මාන්තයේ ප්‍රධාන සංධිස්ථානයක් විය. සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ ශ්‍රී ලංකාවට සංචාරකයින් මිලියන 1.9 ක් පැමිණ තිබේ. මෙය ජාතික දළ දේශීය නිෂ්පාදිතයෙන් 4.3% ක් වන අතර සමස්ත ආදායම ඇමරිකානු ඩොලර් බිලියන 3.6 කි. සංචාරක කර්මාන්තය තුළ ජනනය කරන ලද සෘජු හා වක්‍ර රැකියා අවස්ථා සංඛ්‍යාව 402,607 කි.

2019 අප්‍රේල් මාසයේ සිදු වූ අනපේක්ෂිත පාස්කු ප්‍රහාරය හේතුවෙන් විවිධ අභියෝග මතු වූ අතර එය විවිධ පැතිවලින් සංචාරක ව්‍යාපාරයට සෘජුවම බලපායි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, 2009 සිට පශ්චාත් සිවිල් යුද්ධ සමයේ පවත්වා ගෙන ගිය වර්ධන වේගය දශකයකට පසු හදිසියේම කඩා වැටුණු අතර සංචාරකයින්ගේ පැමිණීමේ වර්ධනය -18% කින් අඩුවිය. කෙසේ වෙතත්, සංචාරක කර්මාන්තය යථා තත්ත්වයට පත් කිරීම සඳහා සංචාරක අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය පියවර කිහිපයක් ගෙන ඇති අතර, සංචාරක කර්මාන්තය පදනම් කරගත් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල සිට මහා පරිමාණ හෝටල් දාම දක්වා කර්මාන්ත පාර්ශ්වකරුවන්ට සහනාධාර පැකේජ ලබා දීම ද ඊට ඇතුළත් ය. එවැනි ප්‍රයත්නයන්හි ප්‍රතිඵලයක් ලෙස, ඉලක්කගත වර්ධන කාලසටහන් වලට අනුව වැටුණු තැනින් නැගී සිටිමින් කර්මාන්තයට සෙමෙන් නමුත් ස්ථාවරව යථා තත්ත්වයට පත්වීමට හැකි වී තිබේ.

පුළුල් පරාසයක සංචාරක කණ්ඩායම් ආකර්ෂණය කර ගැනීම සඳහා ජනතා කේන්ද්‍රීය සංචාරක ව්‍යාපාරයක් සහතික කිරීමේ වැදගත්කම හඳුනා ගනිමින් අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා ශ්‍රී ලංකාව පිළිබඳ සිය දැක්ම පැහැදිලිව නිර්වචනය කර ඇති බැවින් මෙම වසර සංචාරක කර්මාන්තයට විශේෂ වැදගත්කමක් දරයි. ඒ අනුව, සංචාරකයින්ගේ පැමිණීම මිලියන 7 ක් දක්වා ඉහළ නැංවීමේ අරමුණින් සංචාරක සංවර්ධන වැඩසටහන දියත් කිරීමට අපේක්ෂා කරන අතර, සංචාරක කර්මාන්තයෙන් දේශීය ආර්ථිකයට වාර්ෂිකව ඇමරිකානු ඩොලර් බිලියන 10 ක විදේශ විනිමය ගලා ඒමක් අපේක්ෂා කරයි.

අවසන් වශයෙන්, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ සභාපතිනිය, අධ්‍යක්ෂ ජනරාල් සහ අධ්‍යක්ෂ මණ්ඩලය ඇතුළු, පෙර නොවූ විරූ අභියෝගවලට මුහුණ දීමට මෙන්ම 2019 වර්ෂයේ අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීමට වෙහෙසී කටයුතු කළ සෙසු සියලුදෙනාට ම මාගේ කෘතවේදීත්වය පුද කිරීමට මෙය අවස්ථාවක් කර ගනිමි.



ප්‍රසන්න රණතුංග
සංචාරක අමාත්‍ය

## සංචාරක අමාත්‍යංශයේ ලේකම්වරයාගේ පණිවිඩය

අතිගරු ජනාධිපතිතුමාගේ "සෞභාග්‍යයේ දැක්ම" නමැති නව දැක්ම හඳුන්වාදීමත් සමඟ සංචාරක ක්ෂේත්‍රය නව දිශාවකට ගෙන යාම සඳහා අවශ්‍ය පරිසරය සංවර්ධනය වෙමින් පවතී. සංචාරක ව්‍යාපාරය ආර්ථික, සමාජීය හා සංස්කෘතික සංවර්ධනය සඳහා බලවේගයක් ලෙස හඳුනාගෙන ඇත. එය දේශීය සංචාරක කර්මාන්තයේ වර්ධනයට සහ රටේ රැකියා උත්පාදනයට වැදගත් දායකත්වයක් සපයයි. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ (SLTDA) 2019 වාර්ෂික වාර්තාවේ මෙම අවස්ථාව පිළිබඳ සටහනක් තැබීමට ලැබීම පිළිබඳ සතුටට පත්වෙමි.

පාස්කු ඉරිදා සිදු වූ අවාසනාවන්ත ත්‍රස්ත ප්‍රහාරය දක්වා විශාල ප්‍රගතියක් ලබා ඇති සංචාරක අංශය 2019 අප්‍රේල් 22 දින සිට විශාල පසුබෑමකට ලක්ව ඇත. ප්‍රහාරයෙන් පසු සංචාරකයින්ගේ පැමිණීම 2018 වර්ෂයේ මැයි මාසයට සාපේක්ෂව 70% පමණ අඩු වී ඇතත්, සංචාරක කර්මාන්තය ස්ථාවර වර්ධනයක් පෙන්නුම් කරමින් සිටියේය.

කෙසේ වෙතත්, සංචාරක කර්මාන්තය නංවාලීම සඳහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ කැපවීම සහ රජයේ මූල්‍ය දිරිගැන්වීම් සමඟින් අපගේ අරමුණු ක්‍රමයෙන් සාක්ෂාත් කර ගැනීමට හැකිවීම සතුටට කරුණකි. ශ්‍රී ලංකාවට ලැබී ඇති විවිධ සම්මාන, වේගයෙන් යථා තත්ත්වයට පත්වීමෙහිලා බලපෑ එක් හේතු සාධකයක් ලෙස සැලකිය හැකි වේ.

මෙම වැඩසටහන් වල ප්‍රතිඵලයක් ලෙස අපේක්ෂිත මට්ටමට වඩා වේගයෙන් යථා තත්ත්වයට පත්විය. මාස හයකට වඩා අඩු කාලයකදී, සියලු පාර්ශවකරුවන්ගේ සාමූහික ප්‍රයත්නයන් හේතුවෙන් සංචාරක වෙන් කිරීමේ රටාව යථා තත්ත්වයට පත් කර ඇති අතර තත්වය යළිත් යහපත් තත්ත්වයට පත්වී තිබේ. තිරසාරභාවය සහ ආර්ථික ශක්‍යතාව සහතික කිරීම සඳහා අපගේ සංචාරක සම්පත් කළමනාකරණය කරන්නේ කෙසේදැයි අපි දැන සිටියෙමු. මෙම පැවති පසුබිමට එරෙහිව ශ්‍රී ලංකාව ලෝකයේ ඉහළම සංචාරක ගමනාන්තයක් ලෙස නම් කිරීම අපට සැලකිය යුතු ජයග්‍රහණයකි.

ශ්‍රී ලංකාවේ සංචාරක ක්ෂේත්‍රයේ සෑම තරාතිරමකම නිලධාරීන් විසින් කරන ලද කැපී පෙනෙන දායකත්වය පිළිබඳව මම කෘතඥ වෙමි. මෙම අමාත්‍යාංශයේ විෂය පථය යටතේ ස්ථාපිත කර ඇති අධ්‍යක්ෂ මණ්ඩලයේ සියලුම සාමාජිකයින්ට ඔවුන්ගේ වගකීම හා සහයෝගය පිළිබඳ දැක්වූ සැලකිල්ල වෙනුවෙන් ස්තූති කිරීමට මම මෙය අවස්ථාවක් කර ගනිමි. සංචාරක ක්ෂේත්‍රයේ පුනර්ජීවනය සඳහා ඔවුන්ගේ සහයෝගය සහ මග පෙන්වීම වෙනුවෙන් සංචාරක හා ගුවන් සේවා ගරු අමාත්‍යතුමාට සහ ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාට මාගේ විශේෂ ස්තූතිය පුද කිරීමට මෙය අවස්ථාවක් කර ගනිමි.

අපගේ ජාතික ආර්ථිකයට වැඩි වටිනාකමක් ලබා දීම සඳහා කර්මාන්තයේ සියලු පාර්ශවකරුවන් සහයෝගය අපි අපේක්ෂා කරමු.



එස්. හෙට්ටිආරච්චි
ලේකම් - සංචාරක අමාත්‍යාංශය

**සභාපතිතුමියගේ පණිවිඩය**

සමාජීය හා ආර්ථික අර්ථයකින් ශක්තිමත් හා ධනාත්මක අතුරුප්‍රතිඵල රාශියක් පෙන්නුම් කරන්නා වූ සංචාරක කර්මාන්තය, ශ්‍රී ලංකාව තුළ ශීඝ්‍රයෙන් වර්ධනය වන ක්ෂේත්‍ර අතුරින් එකක් වශයෙන් හඳුනාගත හැකි ය. 2019 ශ්‍රී ලංකා සංචාරක ව්‍යාපාරයට අභියෝගාත්මක වසරක් වුවද, සමස්තයක් ලෙස කර්මාන්තයේ ප්‍රගතිය සහ විවිධාංගීකරණය දැකගත හැකිය.

වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව මෙන්ම වෙළෙඳපොළ සංවර්ධන පහසුකම (MDF) සමග සංචාරක කර්මාන්තයේ උපායමාර්ගික වර්ධනය තහවුරු කරනු වස් මෙම ආයතන සමග සහයෝගීතාව වර්ධනය කිරීම සඳහා අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීම, සමාලෝචිත වර්ෂය තුළ ප්‍රධාන වශයෙන් කැපී පෙනෙන කරුණු අතර වේ. සංචාරක ක්ෂේත්‍රයේ නිපුණතා සංවර්ධනය හා පුහුණුව සඳහා ශ්‍රී ලංකාවට ආසියානු සංවර්ධන බැංකුවේ ප්‍රදානයක් ද ලැබුණි. තවද, එක්සත් ජාතීන්ගේ ලෝක සංචාරක සංවිධානයේ (UNWTO) දකුණු ආසියානු කොමිෂන් සභාවේ උප සභාපතිවරුන් දෙදෙනෙකුගෙන් එක් අයෙකු ලෙස ශ්‍රී ලංකාව 2019 සිට 2021 දක්වා කාලය තුළ පත් කරන ලද අතර එය ජාත්‍යන්තර පිළිගැනීමක් ලබා ගැනීමේදී සුවිශේෂී ජයග්‍රහණයකි.

2019 අප්‍රේල් මාසයේ දී පාස්කු ඉරිදා ප්‍රහාර මගින් සංචාරක ක්ෂේත්‍රය ඇතුළු සමස්ත ජාතියටම විශාල පාඩුවක් සිදුවිය. එවැනි අහිතකර තත්ත්ව හමුවේ වුව ද මධ්‍යයේ ශ්‍රී ලංකා සංචාරක ව්‍යාපාරය 2019 වසර අවසානයේදී ආර්ථිකයට ඩොලර් බිලියන 3.6 ක සමස්ත වාර්ෂික විදේශ ආදායමක් ලබා දෙමින් රටේ දළ දේශීය නිෂ්පාදිතයට 4.3% ක සෘජු දායකත්වයක් ලබා දුන්නේය. මෙම වසර තුළ ශ්‍රී ලංකා සංචාරක ව්‍යාපාරය තුළින් රට තුළ සෘජු හා වක්‍ර රැකියා අවස්ථා රාශියක් ජනිත විය.

2019 දී යෝජනා කරන ලද ජාතික ප්‍රතිපත්ති රාමුවට අනුකූලව, ප්‍රජා පාදක සංචාරක නිෂ්පාදන වැඩිදියුණු කිරීම, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ලියාපදිංචි කිරීම, රාජ්‍ය සේවා සහ යටිතල පහසුකම් වැඩි කිරීම මගින් ශ්‍රී ලංකාවේ සංචාරක ක්ෂේත්‍රයේ කාර්ය සාධනය වැඩි දියුණු කිරීමට ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය සැලසුම් කරයි. මෙවැනි වැඩසටහන් මගින් සංචාරක හා ආගන්තුක සත්කාරය පදනම් කරගත් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට මෙන්ම ග්‍රාමීය ප්‍රජාවට ද අවස්ථා උදා වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

සංචාරක ව්‍යාපාරය යනු නිරන්තරයෙන් උඩු යටිකුරු වන ඉතා ගතික හා අස්ථාවර කර්මාන්තයකි. අපගේ අභියෝග කුමක් වුවත්, ශ්‍රී ලංකා සංචාරක කර්මාන්තය, සංචාරක තිරසාර බව ශක්තිමත් කිරීමටත්, ආර්ථිකයේ සහ ශ්‍රී ලංකාවේ ජනතාවගේ අභිවෘද්ධිය සඳහා වර්ධන ඉලක්ක සපුරා ගැනීමටත් උනන්දුවෙන් කටයුතු කරයි. කර්මාන්තයේ අභියෝග භාරගෙන අනාගතය සඳහා ඔරොත්තු දීමේ හැකියාව ලබා දීම සඳහා අපි දැඩි අවධානයක් සහිත වටිනාකම් සහ ප්‍රතිඵල මත පදනම් වූ සංස්කෘතියක් සමඟ අපගේ කණ්ඩායම ගොඩනඟමු.



කිමාලි ප්‍රනාන්දු මහත්මිය
සභාපතිනිය - ශ්‍රී ලංකා සංචරණය

## අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයින්



**කිමාලි ප්‍රනාන්දු මිය**
සභාපතිනිය - ශ්‍රී ලංකා සංචරණය

කිමාලි ප්‍රනාන්දු මිය, ශ්‍රී ලංකා සංචරණයේ සභාපතීත්වය දරමින්, රජයේ ප්‍රධාන සංචාරක ආයතන හතර පාලනය කරයි. මෙරට සංචාරක ක්ෂේත්‍රයේ මණ්ඩල හතරටම එක් සභාපති තනතුරක් පත් කළ පළමු අවස්ථාව මෙයයි. එමෙන්ම, ඇය එම තනතුර දරන පළමු කාන්තාව ද වෙයි.

වසර 30 කට වැඩි  පළපුරුද්දක් සහිත කිමාලි ප්‍රනාන්දු මහත්මිය මනා අවධානයක් ඇති, අධිෂ්ඨානශීලී මෙන්ම ඉලක්ක සපුරා ගැනීමෙහිලා දක්ෂ ආයතන නිලධරයෙකි. ඇය සතුව දේශීය සහ ජාත්‍යන්තරය තුළ බැංකු ක්ෂේත්‍රයේ මෙන්ම පෞද්ගලික අංශයේ ද ආයතනික පාලනය සහ ආචාරධාර්මික භාවිතයන් පිළිබඳ වාර්තාගත පළපුරුද්දක් ඇත. ඇය මේ වන විටත්, ලැයිස්තුගත සමාගම් කිහිපයකම සේවය කර ඇත. එමෙන්ම, ඇය ලන්ඩන් ආර්ථික හා දේශපාලන විද්‍යා පාසලෙන් එල්එල්බී (ගෞරව) උපාධියක් ලබා ඇති අතර එක්සත් රාජධානියේ ලින්කන්ස් ඉන් (Lincoln’s Inn) හි අධි නීතිඥවරියක් ලෙසත් ශ්‍රී ලංකාවේ නීතීඥවරියක් ලෙසත් කටයුතු කරයි.



**ධම්මිකා විජයසිංහ මහත්මිය**
අධ්‍යක්ෂ ජෙනරාල්තුමිය

පේරාදෙණිය විශ්ව විද්‍යාලයෙන් සත්ව විද්‍යාව පිළිබඳ (ගෞරව) උපාධියක් 1996 වසරේදී හිමි කරගත් ධම්මිකා විජයසිංහ මහත්මිය, 2009 දී නෙදර්ලන්තයෙන් ශිෂ්‍යත්වයක්ද ලබා හිමි කරගෙන තිබේ. නාගරික කළමනාකරණය හා සංවර්ධනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියද ඇය විසින් සම්පූර්ණ කර තිබේ. 2013 වසරේදී කොළඹ විශ්ව විද්‍යාලයෙන් හිමි කරගත් පරිසර විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ද සතු වෙයි.

2000 වසරේදී, ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරිනියක ලෙස රාජ්‍ය අංශයට බැඳුණු ඇය සතුව, රාජ්‍ය සේවයේ නාගරික සංවර්ධන, නිවාස, අධ්‍යාපන හා පරිසර යන ක්ෂේත්‍රවල වසර 19 කට වැඩි පළපුරුද්දක් තිබේ. ඇය 2018 වසරේදී මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයට බැඳීමට පෙර යුනෙස්කෝවේ ශ්‍රී ලංකා ජාතික කොමිෂන් සභාවේ මහලේකම්වරිය ලෙසද වසර පහක් සේවය කර තිබේ.

එමෙන්ම, ඇය පරිසර සැලසුම් හා ආර්ථික අධ්‍යක්ෂවරියක මෙන්ම පරිසර දූෂණය පාලනය හා රසායනික කළමනාකරණ අධ්‍යක්ෂවරියක ලෙස ද කටයුතු කර ඇති අතර, පරිසරය හා සම්බන්ධ වැදගත් ව්‍යාපෘති කිහිපයක ව්‍යාපෘති අධ්‍යක්ෂ-වරියක ලෙසද ඇගේ සේවය පිරි නමා තිබේ.

## අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයින්



### පී. තිලක් වීරසිංහ මහතා
මණ්ඩල සාමාජික

තිලක් වීරසිංහ මහතා ඉමහත් උද්යෝගයෙන් යුතු, සැලකිලිමත්ව හා වගකීමෙන් කටයුතු කරන, ස්වයං අභිප්‍රේරණයක් සහිත තනිව ගොඩනැගුනු අතිසාර්ථක ව්‍යවසායකයෙකි. ඒ මහතාට සත්කාර කර්මාන්තයේ පවතින ප්‍රගතිශීලී සමාගම් සමූහයක් ලංකා ස්පෝට්‍රයිසන් (Lanka Sportreizen) නාමය යටතේ අත් කර ගැනීමට සහ ඒවා තහවුරු කර ගැනීමට ඉමහත් උද්යෝගයක් සහ අධිෂ්ඨානයක් ඇත.

ජල ක්‍රීඩා කෙරෙහි සුවිශේෂ නැඹුරුවක් ඇතිව තවත් ක්‍රීඩා රැසක දස්කම් පෑ ඒ මහතා ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය තුළ බොහෝ උප අංශයන් මේ වන විට වර්ධනය කර ඇති අතර එය විවිධාංගීකරණය කොට සාර්ථක ව්‍යාපාරයක් බවට පත් කිරීමට සමත් විය.

වීරසිංහ මහතා තුල ශ්‍රී ලංකාව විනෝදාත්මක කටයුතු සඳහා ප්‍රමුඛ ගමනාන්තයක් බවට පත් කළ හැකි බවට දැඩි විශ්වාසයක් ඇති අතර, එමගින් ක්‍රීඩා ඉසව් තුළින් සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම ඔහුගේ අදහසයි. මෙම පරමාර්ථය මනසේ තබා ගනිමින් වීරසිංහ මහතාගේ මඟ පෙන්වීම යටතේ LSR සමූහය විවිධ ක්‍රීඩා ඉසව් සංවිධානය සඳහා අනුග්‍රහය දක්වයි.

දේශීය හා ජාත්‍යන්තර වශයෙන් විවිධ ආයතනවල ක්‍රීඩකයෙකු, ව්‍යාපාරිකයෙකු සහ ව්‍යවසායකයෙකු ලෙස ඔහු ලබා ඇති ජයග්‍රහණ වෙනුවෙන් ඔහු ඉහළ පිළිගැනීමට ලක්විය.



### එම්. ශාන්තිකුමාර් මහතා
මණ්ඩල සාමාජික

රාජ්‍ය හා පෞද්ගලික ආයතන කිහිපයක අධ්‍යක්ෂ මණ්ඩලයේ සේවය කරන ශාන්තිකුමාර් මහතා සතුව ක්ෂේත්‍ර කිහිපයකම පෘථුල දැනුමක් හා පළපුරුද්දක් වෙයි. ඔහු අල්හම්බ්‍රා හොටෙල්ස් ලිමිටඩ් හි අධ්‍යක්ෂවරයා මෙන්ම, (Ramada by Wyndham - රමාඩා බයි වින්ඩම් හි හිමිකරු සහ ක්‍රියාකරු), කාල්ටන් ටුවර්ස්, ලිට්‍රෝ ගෑස් ලංකා ලිමිටඩ්, ලිට්‍රෝ ගෑස් ටර්මිනල් ලංකා පුද්ගලික සමාගම, කොළඹ නාගරික සංචාරක හෝටල් සංගමයේ සභාපති සහ ශ්‍රී ලංකාවේ හෝටල් සංගමයේ උප සභාපතිවරයා වශයෙන්ද කටයුතු කරයි.

තවද, එක්සත් රාජධානියේ ලන්ඩන් හි ව්‍යාපාර කළමනාකරණ සංගමය, එක්සත් රාජධානියේ විකුණුම් හා අලෙවිකරණ සංගමය, එක්සත් රාජධානියේ ආගන්තුක සත්කාරය සහ එක්සත් රාජධානියේ තේම්ස් විද්‍යාලයීය සංචාරක හා ආගන්තුක සත්කාරක ආයතනය යන ආයතනවල සාමාජිකත්වය ඔහුට හිමිව තිබේ.

## අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්



**වන්න විජේමාන්න මහතා**
මණ්ඩල සාමාජික

ජෝර්ජ් ස්ටුවර්ට් ට්‍රැවල්ස් ලිමිටඩ් හි අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරී වන්න විජේමාන්න මහතා සංචාරක හා සංචාරක කර්මාන්තයේ ප්‍රවීණයකි. ශ්‍රී ලංකාවේ සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ අධ්‍යක්ෂක, ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහන සංගමයේ හිටපු සභාපති හා හිටපු උප සභාපති ලෙස ප්‍රධාන තනතුරු කිහිපයක් ඔහු විසින් හොබවනු ලැබ තිබේ. එමෙන්ම, ශ්‍රී ලංකාවේ සංචාරක නියෝජිතයින්ගේ සංගමයේ සභාපතිවරයා මෙන්ම ජෝර්ජ් ස්ටුවර්ට් ඒවියේෂන් (පුද්ගලික) සමාගමේ අධ්‍යක්ෂවරයා ලෙසද හෙතෙම සේවය කරයි.
වන්න විජේමාන්න මහතා, ඇමරිකා එක්සත් ජනපදයේ ටෙක්සාස් හි හියුස්ටන් ක්ලියර් ලේක් විශ්ව විද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක්ද හිමි කරගෙන තිබේ.



**ඉෂාන් ජයසේකර මහතා**
මණ්ඩල සාමාජික

මෘදුකාංග සංවර්ධනය හා මෘදුකාංග සංවර්ධන ජීවචක්‍ර ප්‍රශස්තිකරණ මෘදුකාංග පිළිබඳ දැනුමක් ජයසේකර මහතා හට ඇත. තාක්ෂණික විශේෂීකරණය තුළින් ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා ඔහු විශේෂඥයෙක් වන අතර ඔහුගේ විශේෂඥ දැනුම බැංකු හා මූල්‍ය, සෞඛ්‍ය සේවා, රක්ෂණ සහ සංචාරක වැනි කර්මාන්තවල භාවිතා කර ඇත. ඔහු ඇමරිකා එක්සත් ජනපදයේ ජේ.පී.මෝගන් චේස්, එක්සත් රාජධානියේ බ්‍රිතාන්‍ය ටෙලිකොම්, ජපානයේ හිටාචි කෝප්, ඕස්ට්‍රේලියාවේ මැකවරි, කටාර්හි කටාර් එයාර්වේස්, කැනඩාවේ මොන්ට්‍රියල් බැංකුව සහ තවත් බොහෝ ජාත්‍යන්තර සමාගම්වල මහා පරිමාණ ව්‍යාපෘතිවල ඔහු වැදගත් ම පුද්ගලයෙකු බවට පත් වී ඇත.

## අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයින්



### ආර් එම් ඩබ් එස් සමරදිවාකර මහතා

මණ්ඩල සාමාජික

අතිරේක ලේකම් (සංවර්ධන) - සංචාරක අමාත්‍යංශය

විද්‍යාවේදී උපාධිය හැදෑරූ ඔහු අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ද ලබා ඇත. ඔහු සිංගප්පූරුවේ ජාතික විශ්ව විද්‍යාලයෙන් ජෛව විවිධත්ව සංරක්ෂණය හා කළමනාකරණය පිළිබඳ එම්.එස්.සී. සහ රාජ්‍ය පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ලබා ඇත. ඔහු මේ වන විට ශ්‍රී ලංකාවේ විවෘත විශ්ව විද්‍යාලයෙන් සිය එල්එල්බී උපාධිය සඳහා සූදානම් වෙමින් සිටී.

ඔහු 1998 සිට ශ්‍රී ලංකා පරිපාලන සේවයේ (විශේෂ ශ්‍රේණියේ) ලේකම්, කොමසාරිස් සහ අධ්‍යක්ෂ තනතුරු හෙබවීය.

කුරුණෑගල "ක්ලයිමට් ස්මාර්ට් සිටි" (Climate Smart City) වැනි සංකල්ප කිහිපයක් සහ වෙනත් ව්‍යාපෘති හඳුන්වාදීමට ඔහු දායක වී ඇති අතර, ඔහු සේවය කරන ආයතනයට ඔහු කළ දැවැන්ත හා අඛණ්ඩ දායකත්වය වෙනුවෙන් සම්මාන, සහතික සහ පිළිගැනීම් කිහිපයක් දිනා ඇත.



### පී එස් පී අබේවර්ධන මහතා

මණ්ඩල සාමාජික

පී. එස්. පී. අබේවර්ධන මහතා උපාධිධාරී පුහුණු ගුරුවරයෙකු ලෙස සිය වෘත්තීය ජීවිතය ආරම්භ කළ අතර එතැන් සිට වසර 23ක සේවා කාලය තුළ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විවිධ තනතුරු හෙබවීය. ඔහු දැනට පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයෙකු ලෙස සේවය කරයි. ඔහු මීට පෙර පළාත් අධ්‍යක්ෂ, පළාත් කොමසාරිස් මෙන්ම පොලොන්නරුව දිස්ත්‍රික් ලේකම් යන තනතුරු ද හෙබවීය.

## අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයින්



**අනෝමා නන්දනී මහත්මිය**
මණ්ඩල සාමාජික

රාජ්‍ය මූල්‍ය කළමනාකරණ ක්ෂේත්‍රයේ වසර 20 කට වැඩි පළපුරුද්දක් ඇති ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරිණියක වන වන අනෝමා නන්දනී මහත්මිය ජාතික අයවැය, රාජ්‍ය මූල්‍ය හා රාජ්‍ය ව්‍යවසාය වැනි මහා භාණ්ඩාගාර විෂය පථය යටතේ ක්‍රියාත්මක වන විවිධ දෙපාර්තමේන්තු කිහිපයකම සේවය කර ඇත. නාගරික සංවර්ධන අධිකාරිය, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව, මිල්කෝ (පුද්) සමාගම, ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල, ගල්ඔය වැවිලි සමාගම, ගල්ඔය හෝල්ඩින්ග්ස් (පුද්) සමාගම, සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය, සෞඛ්‍ය, ක්‍රීඩා සහ ජල සම්පාදන යන විෂයයන් සඳහා පවරා ඇති ප්‍රසම්පාදන කමිටු විසින් පත් කරන ලද ස්ථාවර කැබිනට් මණ්ඩල කිහිපයකම කටයුතු කරමින් අනෝමා නන්දනී මහත්මිය මහා භාණ්ඩාගාරය නියෝජනය කර ඇත.

## අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයින්

අධ්‍යක්ෂකවරුන්



**තරංගා රූපසිංහ මහත්මිය**
අධ්‍යක්ෂ, ප්‍රමිති සහ තත්ත්ව සහතික

රූපසිංහ මහත්මිය වසර 18කට වැඩි පළපුරුද්දක් ඇති පෞද්ගලික, අර්ධ රාජ්‍ය මෙන්ම රාජ්‍ය අංශ තුළ සුවිශේෂී සැලසුම්කරණය, ක්‍රියාත්මක කිරීම සහ නායකත්ව ලක්ෂණ මගින් වාර්තාගත පළපුරුද්දක් පෙන්නුම් කරන සුදුසුකම්ලත් පරිපාලන සේවා නිලධාරිණියක වේ.

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ MBA උපාධිධාරිනියක් වන ඇය කැලණිය විශ්ව විද්‍යාලයෙන් ව්‍යාපාර කළමනාකරණය (ගණකාධිකරණ) විශේෂ උපාධිය සම්පූර්ණ කර දෙවන ඉහළ පන්තියේ ගෞරව උපාධියක් ලබා ඇත.

ඇය ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයෙන් (සී.සී.ඒ) උපාධියක් ලබා ඇති අතර ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයෙන් (අයි.බී.එස්.එල්) බැංකු හා මූල්‍ය පිළිබඳ උසස් සහතිකය (ඒ.සී.බී.එෆ්) ලබා ඇත. ඇය අයි.සී.ඒ.එස්.එල් හි සාමාජික කමිටුවේ (සී.බී.ඒ පීඨයේ) විකල්ප සභාපතිවරියක ලෙස සේවය කරන අතර 2013 සිට ශ්‍රී ලංකාවේ විවෘත විශ්ව විද්‍යාලයේ බාහිර කථිකාචාර්යවරියකි.

ඇය දෙමළ භාෂාවෙන් සහතික මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර ඇති අතර ඇය මෙරට රාජ්‍ය භාෂාවලින් ප්‍රවීණයෙකි.

රටවල් දහයකින් කොරියානු ජනරජයේ ''සත්කාරක නිවාස ගම්මාන සංවර්ධන ව්‍යාපෘතිය'' (Home Stay Village Development Project) පිළිබඳ ඉදිරිපත් කරන ලද හොඳම ක්‍රියාකාරී සැලැස්ම සඳහා සම්මානයට පාත්‍ර වූ ශ්‍රී ලංකා සංචාරක කණ්ඩායමට ඇය නායකත්වය ලබා දී තිබේ.



**චන්දන විජේරත්න මහතා**
අධ්‍යක්ෂ, නිකේතන පරිපාලන

ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ උපාධිධාරියෙකු වන චන්දන විජේරත්න මහතාට හෝටල් හා ආහාරපාන කළමනාකරණ ඩිප්ලෝමාව සමග ආහාරපාන හා මෙහෙයුම් පිළිබඳ විශේෂඥ පළපුරුද්දක් සතු වෙයි. ශ්‍රී ලංකා හෝටල් පාසල් උපාධිධාරී සංගමයේ සාමාජිකයෙකු වන හෙතෙම හෝටල් හා සංචාරක කටයුතු සඳහා බෙහෙවින් කැප වී ඇත.

එවකට ලංකා ඔබරෝයි හෝටලයේ (දැන් සිනමන් ග්‍රෑන්ඩ්) සිය වෘත්තීය ජීවිතය ආරම්භ කළ ඔහු ඩුබායි හි ජබෙල් අලි රිසෝර්ට් ඇන්ඩ් ස්පා හෝටලයේ සේවය කිරීමට පෙර ආහාරපාන අංශයේ වසර ගණනාවක් සේවය කර තිබේ. ඉන් අනතුරුව විජේරත්න මහත SLTDA හි අංශ ගණනාවක සාමාජිකයෙකු ලෙසින් වික්‍රමාන්විත ක්‍රීඩා, සුවතා සංචාරක ව්‍යාපාරය, සංචාරක සහ ලෝක කුළුබඩු ආහාර උත්සව වැඩසටහන් සඳහා විශේෂ අවධානයක් යොමු කරයි.

## අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයින්

අධ්‍යක්ෂකවරුන්



### චින්තක අබේකෝන් මහතා

අධ්‍යක්ෂ - තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

මෙරට ප්‍රමුඛ පෙළේ සම්පිණ්ඩිත සමාගම් සහ තොරතුරු තාක්ෂණ සමාගම් කිහිපයකට අනුයුක්තව කටයුතු කර තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රය පිළිබඳ වසර 20කට අධික පළපුරුද්දක් ඇති අබේකෝන් මහතාට ශ්‍රී ලංකා සංචාරක ව්‍යාපාරයේ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ ක්‍රියාකාරිත්වය මෙහෙයවීම පිළිබඳ හසල දැනුමකින් සන්නද්ධ මනා පළපුරුද්දක් ඇත.

අබේකෝන් මහතා සිය පෙර ධුරවල පවා ශ්‍රී ලංකාවේ ඇති සම්පිණ්ඩිත සමාගම් මෙන්ම එක්සත් ජනපදයේ සහ ඉන්දියාවේ පිහිටා ඇති ඒවායේ සමරූපී සමාගම් තුළ ඇති අදාළ අංශවල තොරතුරු හා සන්නිවේදන උපායමාර්ග ක්‍රියාත්මක කිරීමේ දී ප්‍රශස්ත භූමිකාවක් හොබවා ඇත. ව්‍යවසාය ශ්‍රේණි අගින් අගට (end-to-end) ව්‍යවසාය සම්පත් කළමනාකරණ (ERP) විසඳුම් ලබා දීමේ සේවාවල නව නිෂ්පාදන හා මුහුවීමට මෙමගින් ඔහුට අවස්ථාව සැලසිණි.

ශ්‍රී ලංකාවේ ඇතැම් වැදගත් රාජ්‍ය අංශ ව්‍යාපෘතිවල ස්වයංකරණ කණ්ඩායම්වල කොටසක්ව කටයුතු කිරීමට අමතරව, අබේකෝන් මහතා අසියානු - පැසිෆික් (APAC) සහ අප්‍රිකානු කලාප තුළ ශ්‍රී ලංකා බීස්පෝක් තොරතුරු තාක්ෂණ විසඳුම් ක්‍රියාත්මක කිරීමේ දී සිය නායකත්වය ද ලබා දී ඇත.

හෙතෙම එක්සත් රාජධානියේ වේල්ස් විශ්වවිද්‍යාලයෙන් MBA උපාධියක් ලබා ඇති අතර එක්සත් රාජධානියේ මැන්චෙස්ටර් මෙට්‍රොපොලිටන් විශ්ව විද්‍යාලයෙන් උපාධියක්ද ලබා ඇත.



### ආචාර්ය ප්‍රසාද් ජයසූරිය මහතා

අධ්‍යක්ෂ - සංචාරක සැලසුම්, සංවර්ධන සහ ආයෝජක සබඳතා

ඉංජිනේරු විද්‍යාව පිළිබඳ උපාධිධාරියෙකු වන හෙතෙම කොළඹ විශ්ව විද්‍යාලයෙන් MBA උපාධිය ලබාගෙන ඇති අතර MBA වැඩසටහනට පිරිනමන රන් පදක්කම් 10 න් 7 ක්ම ලබාගෙන ඇති අතර, ඉතා දුර්ලභ ජයග්‍රහණයක් වන සමස්ත කාර්ය සාධනය සඳහා වන පදක්කම ද ඔහුට ලබා දී ඇත. එමෙන් ඔහු කළමනාකරණ විද්‍යා හා ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ආචාර්ය උපාධියක් ලබා ඇත. ප්‍රසාද් ජයසූරිය මහතා පෞද්ගලික හා රාජ්‍ය අංශයේ වසර 23 කට වැඩි සේවා පළපුරුද්දක් ලබා තිබේ. වසර 20 ක් පුරා පෞද්ගලික අංශයේ ඔහු හොබවන ලද තනතුරු අතර දේශීය හා බහුජාතික සමාගම්වල සාමාන්‍යාධිකාරී තනතුර, දේශීය ප්‍රධානියා සහ අධ්‍යක්ෂ යන තනතුරු ඇතුළත් වේ. ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයේ පත්වීමට පෙර හෙතෙම ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සැලසුම් අධ්‍යක්ෂක ලෙස කටයුතු කළ අතර, එහිදී ඔහු 2019-2023 කාලය සඳහා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ උපායමාර්ගික සැලැස්ම සංවර්ධනය කිරීමට දායක විය. එමෙන්ම ඔහු ශ්‍රී ලංකා පදනම් ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස ද සේවය කරයි.

ඔහු කොළඹ විශ්ව විද්‍යාලය විසින් පවත්වනු ලබන ව්‍යාපාර පරිපාලනවේදී ශාස්ත්‍රපති උපාධිය (MBA) හා ඉදිකිරීම් කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (MMM) යන පාඨමාලාවල, සහ පශ්චාත් උපාධි, උපාධි වැඩසටහන්වල බාහිර කථිකාචාර්යවරයෙකි.

## අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයින්

අධ්‍යක්ෂකවරුන්



**මිහිර ලියනාරච්චි මහතා**
අධ්‍යක්ෂ - මානව සම්පත් හා පරිශ්‍ර කළමනාකරණය

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ වසර 23ක පළපුරුද්දක් ඇති මිහිර ලියනාරාච්චි මහතා මූල්‍ය කළමනාකරණය, මානව සම්පත් හා පරිශ්‍ර කළමනාකරණය, නිවාඩු නිකේතන කළමනාකරණය සහ දේශීය සංචාරක හා ප්‍රජා සම්බන්ධතා යන අංශවල සේවය කර ඇති ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂවරයෙකි.

ඔහු කළමනාකරණ විද්‍යාවේදී (විශේෂ) උපාධියක් ලබා ඇති අතර ශ්‍රී ලංකාවේ ගණකාධිකරණ තාක්ෂණ ශිල්පීන්ගේ සංගමයේ ජ්‍යෙෂ්ඨ සාමාජිකයෙකු මෙන්ම රාජ්‍ය මූල්‍ය ආයතනයේ සාමාජිකයෙකි.

ශ්‍රී ලංකාවේ කුඩා හා මධ්‍ය පරිමාණ සංචාරක ක්ෂේත්‍ර සංවර්ධනය කිරීමට මෙන්ම දේශීය සංචාරක කර්මාන්තය සඳහා නව සංකල්ප හඳුන්වාදීමට ("තානායම් අලුත් වෙලා Thanayam Aluth Vela" සහ "ටුවරිසම් ටුක්ටුක් Tourism Tuk Tuk") ද ඔහු දායක වී ඇත.



**සම්පත් ගනේපළආරච්චි මහතා**
අධ්‍යක්ෂ - මූල්‍ය කළමනාකරණය

මූල්‍ය අධ්‍යක්ෂ, මූල්‍ය ප්‍රධානී වැනි ඉහළ පෙළ කළමනාකරණ තනතුරු දරමින් ගනේපළආරච්චි මහතාට ජාත්‍යන්තර ගුවන් සේවයක වසර 7කට වැඩි පළපුරුද්දක් ද ප්‍රධාන පෙළේ දේශීය සමාගම්වල වසර 13 කට අධික සේවා පළපුරුද්දක් ද ඇතුළු ව්‍යාපාර ක්ෂේත්‍රයේ වසර 20කට වඩා දිවෙන පළපුරුද්දක් ඇත.

ඔහු කොළඹ විශ්ව විද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා ඇති අතර ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාවේදී උපාධියක්ද හිමි කරගෙන තිබේ.

සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ (CMA) සහ ශ්‍රී ලංකා රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරී සංගමයේ ආශ්‍රිත සාමාජිකයෙකු වන ගනේපළආරච්චි මහතා, ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනයේ (ATT) මෙන්ම ශ්‍රී ලංකා වරලත් ව්‍යාපාර පරිපාලන ආයතනයේ අධි සාමාජිකයෙකු ද වේ.

## අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්

අධ්‍යක්ෂකවරුන්



### පී උපාලි රත්නායක මහතා

අධ්‍යක්ෂ - දේශීය සංචාරක හා ප්‍රජා සම්බන්ධතා

ශ්‍රී ලංකා සංචාරක ව්‍යාපාරයේ වසර 24 ක සේවා කාලයක් ඇති ප්‍රවීණ සංචාරක වෘත්තිකයෙකු වන ඔහු 1995 දී කළමනාකරණ අභ්‍යාසලාභියෙකු ලෙස සම්බන්ධ වූ අතර දේශීය සංචාරක, ප්‍රමිති සහ තත්ත්ව සහතික, සැලසුම් සහ සංවර්ධන අධ්‍යක්ෂ ලෙස වසර ගණනාවක් තිස්සේ ක්ෂේත්‍රයේ තීරණ ගැනීමේ ඉහළම තලයට පැමිණියේය. වසර දෙකක කාලයක් සඳහා 2018 දී අධ්‍යක්ෂ ජනරාල් ධුරය භාර ගැනීමට පෙර ඔහු 2012 දී ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ (SLITHM) රෙජිස්ට්‍රාර්වරයා ලෙස දීර්ඝ කාලයක් සේවය කර තිබේ.

ඔහු කොළඹ විශ්වවිද්‍යාලයෙන් ආර්ථික විද්‍යාව පිළිබඳ උපාධියක් ලබා ඇති අතර ආර්ථික විද්‍යාව පිළිබඳ විශේෂඥයෙක් ද වේ. තායිලන්තයේ ප්‍රින්ස් ඔෆ් සොන්ග්ලාර් විශ්වවිද්‍යාලයේ සංචාරක හා ආගන්තුක සත්කාරය පිළිබඳ MBA උපාධිය සම්පූර්ණ කල ඔහු බෙල්ජියමේ ඩබ්ලිව්.ඊ.එස්. කොලෙජ් වෙතින් සහ නෙදර්ලන්තයේ මාස්ට්‍රික්ට් ස්කූල් ඔෆ් මැනේජ්මන්ට් වෙතින් සංචාරක සැලසුම් හා සංවර්ධනය පිළිබඳ පශ්චාත් උපාධි සංචාරක අලෙවිකරණය පිළිබඳ ඩිප්ලෝමාව සම්පූර්ණ කළේය. ඔහු ජපානයේ සහ ඕස්ට්‍රේලියාවේ හරිත පරිසර සංචාරක ව්‍යාපාරය පිළිබඳ විශේෂ පුහුණුවක් ලබා ඇත.

ඔහු තිරසාර සංචාරක ව්‍යාපාරයේ උපදේශකයෙකු වන අතර ගෝලීය තිරසාර සංචාරක මණ්ඩලය (GSTC) විසින් සහතික කරන ලද තිරසාර සංචාරක කර්මාන්තය පිළිබඳ ජාත්‍යන්තර විගණකවරයෙකි. ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරය තිරසාර කිරීම සඳහා වන පළමු පියවර ලෙස සැලකෙන ශ්‍රී ලංකාවට ජාතික තිරසාර සංචාරක සහතික කිරීමේ (NSTC) යෝජනා ක්‍රමය හඳුන්වා දීමට ඔහු පුරෝගාමී විය.

ඔහුගේ අනෙකුත් ප්‍රධාන දායකත්වයන් අතර පාසිකුඩා නව නිවාඩු නිකේතන සංවර්ධනය, දෙද්දුව අක්කර 1100 ක් අත්පත් කර ගෙන දූපත් සංචාරක නිකේතන හඳුන්වාදීම සහ ශ්‍රී ලංකාවේ "සත්කාරක නිවාස" "Homestay Village" සංකල්පය හඳුන්වාදීම ඇතුළත් වේ.

ඔහු ජාත්‍යන්තර සමුළුවල වසර ගණනාවක් පුරා ශ්‍රී ලංකාව නියෝජනය කර ඇති අතර තායිලන්තයේ ගෝලීය තිරසාර සංචාරක සමුළුවේ සහ භූතානයේ පැවති පැසිෆික් හා දකුණු ආසියාවේ ඒකාබද්ධ කොමිෂන් සභා රැස්වීමේ කථිකයෙකු ලෙස කටයුතු කර ඇත.

පර්යේෂණ පත්‍රිකා කිහිපයක් ද සංචාරක කර්මාන්තය පිළිබඳ ග්‍රන්ථයක් ද රත්නායක මහතා ප්‍රකාශයට පත් කර ඇත.

## අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයින්

අධ්‍යක්ෂකවරුන්



### උදාන වික්‍රමසිංහ මහතා

අධ්‍යක්ෂ - පර්යේෂණ සහ ජාත්‍යන්තර සබඳතා

බැංකුකරණයෙන් සිය වෘත්තීය ජීවිතය ආරම්භ කර තොරතුරු තාක්ෂණයට පිවිසීම ඩිජිටල් හා ව්‍යාපාරික යන දෙඅංශයේම අත්දැකීම් ලබා ගැනීමට ඔහුට උපකාරී වූ අතර ඔහු වසර 24 කට වැඩි පළපුරුද්දක් ඒ තුලින් ලබාගනු ලැබීය.

ඔහු එක්සත් රාජධානියේ සන්ඩර්ලන්ඩ් විශ්ව විද්‍යාලයෙන් තොරතුරු තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී උපාධියක් ලබා ඇති අතර ඕස්ට්‍රේලියාවේ වික්ටෝරියා විශ්ව විද්‍යාලයෙන් MBA උපාධියක් ලබා ඇත. ඔහු බ්‍රිතාන්‍ය පරිගණක සංගමයේ (BCS) වරලත් තොරතුරු තාක්ෂණ වෘත්තිකයෙකු (CITP-UK) වන අතර වර්තමානයේ බ්‍රිතාන්‍ය පරිගණක සංගමයේ (BCS) තක්සේරුකරුවෙකු ලෙස සේවය කරයි. ශ්‍රී ලංකාවේ පරිගණක සංගමයේ (CSSL - MCS) සාමාජිකයෙකු මෙන්ම CSSL හි විධායක සභාවේ හිටපු අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකි. ඔහුගේ අනෙකුත් සාමාජිකත්වයන් අතර ඇමරිකා එක්සත් ජනපදයේ IEEE (විදුලි හා ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු ආයතනය) සහ IBSL (ශ්‍රී ලංකාවේ බැංකුකරුවන්ගේ ආයතනය) වේ.



### ඉනෝකා පුංචිහේවා මහත්මිය

නියෝජ්‍ය අධ්‍යක්ෂ - නීති ඒකකය

2005 වර්ෂයේ දී ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියට නීති නිලධාරියෙකු වශයෙන් සම්බන්ධ වූ පුංචිහේවා මහත්මිය, නීති අංශය මුල සිට ම ගොඩනගා ඇති අතර එවක පටන් මේ දක්වා එම අංශය වෙත සිය නායකත්වය ද ලබා දෙන්නී ය. ඇය නීතිඥවරියක්, නොතාරිස්වරියක් සහ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් ධුරය දැරී ය.

මුලින් අපරාධ සම්බන්ධ නීතිඥවරියක ලෙස අවිස්සාවෙල්ල උසාවියෙන් පුහුණුවීම් ආරම්භ කළ ඇය පසුව 1996 දී ධීවර සංස්ථාවට නීති නිලධාරිනියක ලෙස සම්බන්ධ වූ අතර එහිදී අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්වරිය ලෙස ද කටයුතු කළාය. 2003 දී ඇය ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ (EDB) සහකාර නීති නිලධාරිනිය ලෙස බඳවා ගන්නා ලදී.

2005 දී ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ නීති නිලධාරිනිය ලෙස සම්බන්ධ වූ ඇය මුල සිටම නීති අංශයෙන් සිය ස්ථාවරය ගොඩනඟා ගත් අතර එතැන් සිට එම අංශයේ ප්‍රධානියා ලෙස කටයුතු කළාය. ඇය නීති නිලධාරිනිය ලෙස කටයුතු කිරීමට අමතරව 2007 සිට 2009 සහ 2012 සිට 2019 නොවැම්බර් දක්වා අධ්‍යක්ෂක මණ්ඩල ලේකම් ලෙස කටයුතු කළාය. ඇය ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ වැඩබලන නීති නිලධාරිනිය සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්වරිය ලෙස ද කටයුතු කර ඇත.

පශ්චාත් සිවිල් යුධ සමය තීරණාත්මක කාල පරිච්ඡේදයක් වූ අතර පුංචිහේවා මහත්මිය නීති නිලධාරී සහ ලේකම් වශයෙන් වෙනම ආයතන දෙකක වැඩ කටයුතු සමතුලිත කිරීමේ තීරණාත්මක කාර්යභාරයක් ඉටු කළාය. මෙකී කාල වකවානුව තුළ සෑම තනතුරකට ම නව ව්‍යාපෘති සහ අභියෝග රැසක් තිබී ඇත.

## අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයින්

අධ්‍යක්ෂකවරුන්



**කේ එම් නහීම් මහත්මිය**

සහකාර අධ්‍යක්ෂ - අභ්‍යන්තර විගණනය

නහීම් මහත්මිය පෞද්ගලික අංශයේ ගණකාධිකරණ හා විගණන ක්ෂේත්‍රයේ වසර 5 කට වැඩි විධායක පළපුරුද්දක් ලබා ඇත. මෙයට අමතරව, විගණන ක්ෂේත්‍රය තුළ වසර 15කට අධික පළපුරුද්දක් ද ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය තුළ ආයෝජන සහ පාරිභෝගික සබඳතා පිළිබඳ වසර 5ක පළපුරුද්දක් ද ඇය සතු ය. නහීම් මහත්මිය ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ සහෝදර සමාගම්වල ද, ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනයේ හා ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ ද විගණන කටයුතු සිදු කර ඇත.

සංචරණ හා සංචාරක කටයුතු පිළිබඳ ඩිප්ලෝමාධාරිණියක් වන ඇය කැළණිය විශ්ව විද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනය සම්බන්ධව MBA උපාධිය සමත් වී ඇත. වරලත් ගණකාධිකරණ ආයතනයේ බලපත්‍රලාභී සුදුසුකම් ද ඇය සතුව ඇත.



# 8

## කර්මාන්ත කාර්ය සාධනය පිළිබඳ විශ්ලේෂණය

### 8.1 ගෝලීය සංචාරක ක්ෂේත්‍රය පිළිබඳ විශ්ලේෂණය

2018 ට සාපේක්ෂව ජාත්‍යන්තර සංචාරකයින්ගේ පැමිණීම 2019 දී +3.8% කින් වර්ධනය විය. එම කාලයේම මැදපෙරදිග කලාපය +8%ක ඉහළ වර්ධනයක් පෙන්නුම් කළ අතර, ආසියානු සහ පැසිෆික් කලාපයද +5% වර්ධනයක් පෙන්නුම් කළහ. යුරෝපා සහ අප්‍රිකානු කලාපවල ජාත්‍යන්තර පැමිණීම්වල (+4% - කලාප දෙකේම) ඉහළ ගිය අතර, ඇමරිකානු කලාපය සියයට +2%ක මධ්‍යස්ථ වර්ධනයක් පෙන්නුම් කළේය. (UNWTO Barometer)

පෙර වසරවලට සාපේක්ෂව කර්මාන්තයක් ලෙස සංචාරක කර්මාන්තය ක්‍රමයෙන් වර්ධනය වෙමින් විවිධාංගීකරණය වෙමින් පවතී. මෙම සංඛ්‍යා ලේඛනවල වැඩිවීම සනාථ කරන්නේ, සංචාරක ව්‍යාපාරය ගෝලීය ආර්ථිකය තුළ වැදගත් කාර්යභාරයක් ඉටු කරන බවයි. එනම්, සිය සාම්ප්‍රදායික භූමිකාවන්ගෙන් ඉවත් වී නව්‍යතම දිශානතීන් කරා ගමන් කරන බවයි.




1 වැනි ප්‍රස්තාරය: කලාප අනුව ජාත්‍යන්තර සංචාරකයින්ගේ පැමිණීම




2 වැනි ප්‍රස්තාරය: මාසික ජාත්‍යන්තර සංචාරක පැමිණීම්

8.2 **ශ්‍රී ලංකා සංචාරක කර්මාන්ත විශ්ලේෂණය**

පසුගිය වසර කිහිපය තුළ රටේ සංචාරකයින්ගේ පැමිණීම සම්බන්ධ වර්ධනයෙහි ධනාත්මක බවක් පෙන්නුම් කරන ලදී. 2019 වසර වාර්තාගත කඩඉමක් බවට පත් කරමින් විශේෂයෙන්ම, ලෝන්ලි ප්ලැනට් සංචාරක සඟරාව මගින් වාර්ෂිකව පැවැත්වනු ලබන සංචාරක සම්මාන උළෙලේදී 2019 වසරේ ලොව සංචාරයට හොඳම රට ලෙස ශ්‍රී ලංකාව නම් කෙරිණි. මේ හේතුවෙන් ශ්‍රී ලංකාව සංචාරකයින් වැඩි පිරිසකගේ ආකර්ෂණයට ලක් වුණු අතර, අප්‍රේල් මාසයේ පාස්කු ඉරිදා සිදු වූ ත්‍රස්ත ප්‍රහාර හේතුවෙන් වසරේ මුල් භාගයේදී සංචාරකයින්ගේ පැමිණීම ඉතා කණගාටුදායක ලෙස අඩු විය.

මෙහි ප්‍රතිඵලය වූයේ සංචාරක කර්මාන්තයට මෙන්ම, සෘජු හා වක්‍ර ලෙස එහි නිරත වන සියලු දෙනාට අඳුරු අවිනිශ්චිත මාස කිහිපයක් ගෙවීමට මෙන්ම දිවයිනේ වැසියන්ගේ අනභිභවනීයභාවය, මේ දිවයින සමග ඇති බැඳීම් හා සම්බන්ධතාවන් සියල්ල රැගෙන සියලු සංචාරකයන්ට ආපසු යාමට සිදු වීමයි. එහෙත් දැඩි අධිෂ්ඨානයෙන් යුතුව රට යථා තත්ත්වයට පත් කිරීම සඳහා බලධාරීන් ගත් වෙහෙස මහන්සිය මගින් පෙන්නුම් කළේ, එම වසරේම ජූලි මාසය වන විට සංචාරකයින්ගේ පැමිණීම යළිත් වරක් ඉහළ යමින් තිබෙන බවයි. අවසානයේදී, ශ්‍රී ලංකාව යළිත් ලෝකයේ ප්‍රධාන සංචාරක ගමනාන්තයක් ලෙස නැවතත් ස්ථාපිත වීමට පටන් ගැණිනි.

සංචාරක පැමිණීම්.




3 වැනි ප්‍රස්තාරය: සංචාරකයින්ගේ පැමිණීම 2015-2019

2018 වසර තුළ මෙරටට පැමිණි 2,333,796 ක සංචාරකයින්ගේ සංඛ්‍යාව හා සසඳන කල, සියයට 18 ක අඩු වීමක් වාර්තා කරමින් 2019 වර්ෂය තුළ ශ්‍රී ලංකාවට සපැමිණි සංචාරකයින්ගේ සංඛ්‍යාව 1,913,702 ක් විය.




4 වැනි ප්‍රස්තාරය: මාසික සංචාරක පැමිණීම්

මාසික සංචාරකයින්ගේ පැමිණීම පිළිබඳ කරන ලද විශ්ලේෂණයකින් හෙළි වූයේ 2019 වසරේ පළමු මාස තුන තුළ සංචාරකයින්ගේ පැමිණීමේ ධනාත්මක වර්ධනයක් පෙන්නුම් කරන බවයි. කෙසේ වෙතත්, අප්‍රේල් මාසයේ පාස්කු ප්‍රහාරයෙන් පසුව, ප්‍රතිශතයේ වෙනස්කම් අවම අගයන් වාර්තා කර ඇත. මැයි මාසයෙන් ඉක්බිතිව වාර්තා වූ ප්‍රතිශත වෙනස (70.8%) ක් විය. මෙම අවස්ථාවෙහිදී, ක්‍රමානුකූලව පැමිණීම වැඩිවීමත් සමග ක්ෂේත්‍රයේ ධනාත්මක ප්‍රවණතාවයක් දක්නට ලැබුණු අතර වර්ෂය අවසාන වන විට දෙසැම්බර් මාසයේදී වාර්තා වූ ප්‍රතිශත වෙනස (4.5%). ක් වී තිබිණි. මෙය සංචාරක කර්මාන්තය වේගයෙන් යථා තත්ත්වයට පත්වීම කියාපාන පැහැදිලි සාක්ෂියකි.

## ඉහළම සංචාරක පැමිණීම් වාර්තා කල රටවල් - 2019

2019 වර්ෂයේ දී 355,002 ක පැමිණීම් ප්‍රමාණයක් වාර්තා කරමින් ඉන්දියාව තවදුරටත් ශ්‍රී ලංකාවට ඉහළ සංචාරක සංඛ්‍යාවක් දායක කරන රට ලෙස පෙරමුණේ සිටින බව සංචාරය සඳහා රට තුළට පැමිණෙන වෙළෙඳපොළවල් පිළිබඳ සිදු කළ විශ්ලේෂණයක් මගින් අනාවරණය විය. එක්සත් රාජධානියේ සිට සංචාරකයින් 198,776 දෙනකු පැමිණීමත් සමග, ශ්‍රී ලංකාවේ දෙවැනි සංචාරක ප්‍රභවය ලෙස එක්සත් රාජධානිය සැලකිය හැකිය. මේ අතර චීනය, ජර්මනිය සහ ඕස්ට්‍රේලියාව පිළිවෙලින් තෙවන, සිව්වන සහ පස්වන ස්ථානවල පසුවේ. 2018 වර්ෂයට සාපේක්ෂව ජාත්‍යන්තර පැමිණීම්වලින් ඉහළ ම වෙළෙඳපොළ දහයෙන් වාර්තාවන සංචාරකයින්ගේ සංඛ්‍යාවේ කිසිදු වෙනසක් වාර්තා වී නොමැති අතර චීනයෙන් හා රුසියාවෙන් වාර්තා වූ සංචාරක පැමිණීම්වල ප්‍රතිශත වෙනස්වීම් හි සැලකිය යුතු අන්තරයක් වාර්තා වීම සැලකිය යුතු වේ.

1
**ඉන්දියාව**
ආගමන - 355,002
% වෙනස - (16.4)

2
**එක්සත් රාජධානිය**
ආගමන - 198,776
% වෙනස - (21.8)

3
**චීනය**
ආගමන - 167,863
% වෙනස - (36.9)

4
**ජර්මනිය**
ආගමන - 134,899
% වෙනස - (14.0)

5
**ඕස්ට්‍රේලියාව**
ආගමන - 92,674
% වෙනස - (16.5)

6
**ප්‍රංශය**
ආගමන - 87,623
% වෙනස - (17.7)

7
**රුසියාව**
ආගමන - 86,549
% වෙනස - (34.2)

8
**ඇමරිකානු එක්සත් ජනපදය**
ආගමන - 68,832
% වෙනස - (8.6)

9
**මාලදිවයින**
ආගමන - 60,278
% වෙනස - (20.8)

10
**කැනඩාව**
ආගමන - 48,729
% වෙනස - (7.5)

9

## පාස්කු ඉරිදා ත්‍රස්ත ප්‍රහාරය

අප්‍රේල් 21 වන දින පාස්කු ඉරිදා බෝම්බ ප්‍රහාරය හේතුවෙන්, ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයට මාස ගණනාවක් තිස්සේම දැඩි අර්බුදකාරී තත්ත්වයකට මුහුණ පෑමට සිදු විය. ඒ වන විටත් දිවයිනේ රැඳී සිටි සංචාරකයින් ආපසු පිටත් කර යැවීමේ කාරණය කෙරෙහි ප්‍රමුඛතාවය ලබා දිය යුතු බව පැහැදිලි කරුණක් විය. ඊට සමගාමීව ත්‍රස්ත ප්‍රහාරයෙන් සෘජුවම පීඩාවට පත් සියලු සංචාරකයින් පිළිබඳව සැලකිලිමත් විය යුතු වූ අතර, ඔවුන්ගේ අවශ්‍යතා සපුරාලීම මෙන්ම, ඔවුන්ගේ ආරක්ෂාවද සහතික විය යුතු විය.

කර්මාන්තය සමග සෘජුව සම්බන්ධව සිටි මිලියන අඩක් පමණ වන පුද්ගලයන් සහ කර්මාන්තයට වක්‍රව සම්බන්ධව සිටි මිලියන දෙකක් පමණ පුද්ගලයන් උදෙසා බලධරයන්හට සහන පියවර ගැනීමට හැකි වූයේ මෙකී කරුණු නිරවුල් කිරීමෙන් පසුව පමණි. ජීවනෝපායන් අකර්මණ්‍යව සෙසු සියල්ල අපේක්ෂාභංගත්වයට පත් වීම හේතුවෙන් ආර්ථික ප්‍රතිලාභ සියලු අංශ කරා විහිදී යාම දැඩි බලපෑමකට ලක් විය. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය හා ඊට අදාළ ආයතන මෙන්ම ප්‍රධාන පාර්ශවකරුවන් සිය රාජ්‍ය හා පෞද්ගලික අංශයන්හි ආයතන හා එක්ව ශ්‍රී ලංකා සංචාරක කර්මාන්තය යළි යථා තත්ත්වයට ගැනීමට වෙහෙස නොබලා නොපමාව අත්වැල් බැඳ ගැනීම ආඩම්බරයට කරුණකි.

### සංචාරක කර්මාන්තයේ පුනර්ජීවනය සඳහා ගනු ලැබූ පශ්චාත්-පාස්කු ප්‍රහාර සම්බන්ධ සහන පියවර

1. **සංචාරක කර්මාන්තය සඳහා වන මූල්‍ය සහන පැකේජය පිහිටු වීම:**

   සංචාරක කර්මාන්තයට ලබා දී ඇති සහන පිළිබඳ චක්‍රලේඛයට අනුව, 2019 අප්‍රේල් 19 වන දින වන විට හිඟ ණය පහසුකම් සම්බන්ධයෙන් 2019 මැයි 21 දින නිකුත් කරන ලද චක්‍රලේඛයට අනුව සංචාරක ක්ෂේත්‍රය ආශ්‍රිත සියලුම ආයතන සඳහා 2020 මාර්තු දක්වා (ප්‍රාග්ධනය සහ පොලී යන දෙඅංශයෙන්ම) රජය විසින් තාවකාලිකව ණය පමා සහන කාලයක් ලබා දෙන ලදී.

2. **2019 ජූලි 7 වන දින අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් මගින් ගුවන්සේවා අංශය වෙත ගොඩබිම හැසිරවීමේ ගාස්තු, ගුවන්යානා ඉන්ධන, සහ අපගමන බද්ද මාස 6ක කාලයක් සඳහා අඩු කිරීම:**

   2019 අප්‍රේල් වන විට ගුවන් සමාගම් 29 ක් සතියකට ගුවන් ගමන්වාර 300 ක් ලබා දෙමින් ශ්‍රී ලංකාවට මහඟු සේවාවක් සලසමින් තිබිණි. කෙසේ වෙතත්, අප්‍රේල් 21 පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් පසුව එම ගුවන් ගමන් වාර සතියකට ගුවන් ගමන් 239 ක් දක්වා අඩු වුණු අතර ඉන් අදහස් කෙරෙන්නේ ගුවන් ගමන් 41 ක් අවලංගු කෙරුණු බවයි. එය චීනය, හොංකොං, ඉන්දියාව, මැලේසියාව, ඕමානය සහ තායිලන්තය යන රටවල් හයෙන් සතියකට 8000 ක පමණ ආසන ප්‍රමාණයක සංචාරකයින් පිරිසක් මෙරටට අහිමිව ගිය බවයි.

   මෙම තත්වය යටතේ, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, අග්‍රාමාත්‍ය කාර්යාලය මෙන්ම සංචාරක සංවර්ධන අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකාවේ සිවිල් ගුවන් සේවා අධිකාරිය එක්ව කැබිනට් පත්‍රිකාවක් කෙටුම්පත් කිරීමට කටයුතු කරන ලදී. එම පත්‍රිකාව මගින් ගුවන් සේවා අංශය සඳහා අවශ්‍ය පිරිවැය වන ගුවන් ඉන්ධන සහ ගුවන් ගමන් ගාස්තු මාස හයක කාලයක් දක්වා අඩු වුණු අතර එය කර්මාන්තයේ ප්‍රගතියට බෙහෙවින් ඉවහල් විය.

3. **ආරක්ෂක සහ ආරක්ෂක උපකරණ මිලදී ගැනීම සඳහා තීරුබදු රහිත සහන:**

   ක්ෂේත්‍රයේ සමස්ත ආරක්ෂාව සහ ආරක්ෂිත ක්‍රමවේද තර කිරීම පිණිස, ශ්‍රී ලංකා හෝටල් සංගමය (THASL) සහ කොළඹ නගර සංචාරක හෝටල් සංගම් විසින් කරන ලද ඉල්ලීම්වලට සවන්දෙමින්, ආරක්ෂක උපකරණ මිලදී ගැනීම සඳහා තීරුබදු රහිත සහන ලබා දී ඇත.

4. **සංචරණ උපදේශන ඉවත් කිරීම:**

නිකුත් කරන ලද සංචරණ උපදේශන ඉවත් කිරීම සඳහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය සියලු ම තානාපති කාර්යාල සමග ඉතා සමීපව කටයුතු කර ඇති අතර ශ්‍රී ලංකාව තුළ සිටින සියලු විදෙස් දූත කණ්ඩායම්වල විශ්වාසය යළි තහවුරු කර ගනු වස් බුද්ධි අංශ නිලධාරීන් සමග ද ආරක්ෂාව පිළිබඳ ලුහුඬු සාකච්ඡා වාර ගණනාවක් සිදු කර ඇත. එහි ප්‍රතිපලයක් ලෙස බොහෝ සංචරණ උපදේශන කෙටි කාලයක් තුළ ඉවත් කෙරිණි.



ශ්‍රී ලංකාවේ අතිගරු චීන තානාපති චෙං සූයුආන් මහතා හමුවීමෙන් අනතුරුව චීනය විසින්
ශ්‍රී ලංකාවට එරෙහිව පනවා තිබූ සංචාරක තහනම ඉවත් කෙරුණු අතර, ශ්‍රී ලංකාව තුළ සංචාරය කිරීම
අවදානම් බවට වන හැඟීන්වීමට පමණක් එම තහනම සීමා කෙරිණි.

5. **රටවල් 48 ක් සඳහා වීසා ගාස්තු ඉවත් කිරීම:**

සංචාරක ව්‍යාපාරය යළි පණ ගැන්වීමට ගත් නොයෙක් ක්‍රියාමාර්ග අතර තවත් එක් වෑයමක් ලෙස ශ්‍රී ලංකාවට වීසා ලබා ගැනීමේ දී අවශ්‍ය වන ඇ.ඩො. 35 ක අනිවාර්ය වීසා ගාස්තුවෙන් 2019 වර්ෂයේ අගෝස්තු මසින් ආරම්භ වන මාස 6කෙ කාල සීමාවක් සඳහා රටවල් 48 ක් නිදහස් කරන ලදි.

ඔස්ට්‍රියාව, ඕස්ට්‍රේලියාව, බෙල්ජියම, බල්ගේරියාව, කැනඩාව, කාම්බෝජය, චීනය, ක්‍රොඒෂියාව, සයිප්‍රසය, චෙක් ජනරජය. ඩෙන්මාර්කය, එස්තෝනියාව, ෆින්ලන්තය, ප්‍රංශය, ජර්මනිය, ග්‍රීසිය, හංගේරියාව, ඉන්දියාව, ඉන්දුනීසියාව, අයිස්ලන්තය, අයර්ලන්තය, ඊශ්‍රායලය, ඉතාලිය, ජපානය, ලැට්වියාව, ලිතුවේනියාව, ලක්සම්බර්ග්, මැලේසියාව, මෝල්ටාව, නෙදර්ලන්තය, නවසීලන්තය, නෝර්වේ, පිලිපීනය, පෝලන්තය, පෘතුගාලය, රුමේනියාව, රුසියාව, සිංගප්පූරුව, දකුණු කොරියාව, ස්ලොවැක් ජනරජය, ස්ලොවේනියාව, ස්පාඤ්ඤය, ස්වීඩනය, ස්විට්සර්ලන්තය, තායිලන්තය, යුක්රේනය, එක්සත් රාජධානිය සහ ඇමරිකා එක්සත් ජනපදය යන රටවල් වීසා ගාස්තුවෙන් නිදහස් වීමට සුදුසුකම්ලත් රටවල් 48 වේ.



රටවල් 48 ක් සඳහා වීසා ගාස්තු ඉවත් කිරීම ප්‍රකාශයට පත් කිරීම සඳහා පැවති මාධ්‍ය හමුව

විවිධ බලධාරීන් සහ ආයතන විසින් හඳුන්වා දුන් සියලු සහන ක්‍රියාමාර්ග තිබියදීත්, විවිධ ජාත්‍යන්තර ආයතන හා ප්‍රජාවන්ගේ මෙන්ම උද්යෝගිමත් විදේශීය සංචාරකයින්ගේ සහයෝගයකින් තොරව, රට සැබෑ ලෙස නැවත පණගැන්වීමට නොහැකි වනු ඇත.

**පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් පසුව ශ්‍රී ලංකාවට ජාත්‍යන්තර ප්‍රජා සහයෝගය**

1. 2019 මැයි මස 2 සහ 3 යන දෙදින ස්පාඤ්ඤයේ ශාන්ත සෙබස්තියන් හි පැවති පස්වන UNWTO ලෝක ආහාරපාන පිළිබඳ සංචාරක සමුළුවට මැදිහත්වීමේ ක්‍රියාමාර්ග යෝජනා කිරීමට ශ්‍රී ලංකාවට අවස්ථාව ලැබුණි.

   ශ්‍රී ලංකාවේ සංචාරක ප්‍රජාව වෙනුවෙන් ලොව පුරා ඉහළ පෙළේ රාජ්‍ය නිලධාරීන්, තානාපතිවරුන්, අමාත්‍යවරුන් සහ ජාත්‍යන්තර නියෝජිතයින් 750 අධික පිරිසක් ඇමතූ, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය හි ජනමාධ්‍ය හා සන්නිවේදන උපදේශිකා පාරමි ප්‍රනාන්දු මෙනවිය, ආරක්ෂක තත්ත්වය සහ ඉදිරි ආරක්ෂක පියවරයන් පිළිබඳව දැනුවත් කරමින් ඔවුන්ට ශ්‍රී ලංකාවට පැමිණීමට ආරාධනා කර ඇත.

2. එක්සත් ජාතීන්ගේ ලෝක සංචාරක සංවිධානයේ මහලේකම් සූරබ් පොලොලිකාශ්විලි මහතා ශ්‍රී ලංකාව වෙත (කර්මාන්තය මෙන්ම රජය විසින් ද ගරු කොට පිළිගනු ලැබූ) සහයෝගීතාවේ වීඩියෝ පණිවුඩයක් එවූ අතර, ශ්‍රී ලංකාවට සංචාරය කර එමගින් ලංකාවේ සංචාරක කර්මාන්තයට සහය දක්වන ලෙස ගෝලීය සංචාරක ප්‍රජාවගෙන් එහි දී ඉල්ලීමක් ද කර ඇත. ඔහු වෙනත් රටවලට ගිය සෑම තැනකම සහයෝගීතාවයේ පණිවුඩය පතුරුවා හරින ලද අතර ශ්‍රී ලංකාව නැරඹීමට පැමිණෙන ලෙසද ඔහු විසින් ජනතාව උනන්දු කෙරිණි.



"සංචාරක කර්මාන්තයෙන් ඔබ්බට විශාල ප්‍රතිලාභ ලබා දෙන සංචාරක ව්‍යාපාරයේ සාර්ථක කතාව ශ්‍රී ලංකාවයි. සංචාරක ව්‍යාපාරය යනු එක්සත්කම සහ අවබෝධයයි. ශ්‍රී ලංකාවට අඛණ්ඩව ගමන් කිරීමෙන් අපි අපගේ සහයෝගය ප්‍රකාශ කරමු" - **පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් පසු ලෝක සංචාරක සංවිධානයේ මහලේකම්, CNN හි රිචඩ් ක්වෙස්ට් මහතා සමඟ පවත්වන ලද සාකච්ඡාවකදී සඳහන් කරයි.**

3. UNWTO 32 වන ඒකාබද්ධ සමුළුව මගින් 4/21 පසු මෙරටට අත්විය හැකි ප්‍රතිලාභ කෙරෙහි අවධානය යොමු කරමින්, 2019 ජුනි මස භූතානයේ තිම්පු හි දී පැවති 31 වන කමිටු සමුළුවේ දී, නැගෙනහිර ආසියාව සහ පැසිෆික් කලාපය (CAP) සඳහා මෙන්ම දකුණු ආසියාව (CSA) සඳහා වන UNWTO කමිටුවේ 32 වන ඒකාබද්ධ සමුළුව ශ්‍රී ලංකාවේ පැවැත්වීම සඳහා ලංසු ඉදිරිපත් කර එය ජයග්‍රහණය කිරීමට ද ශ්‍රී ලංකාව සමත් විය. මෙය එක්සත් ජාතීන්ගේ ලෝක සංචාරක සංවිධානයේ ආසියාවේ සහ පැසිෆික් කලාපයේ ප්‍රධාන වාර්ෂික උත්සවය වන අතර රජයේ ඉහළ නිලධාරීන්ගේ සහ කර්මාන්ත විශේෂඥයන්ගේ සහභාගීත්වය ඊට හිමිවේ.



## 10

### වසරක කාලයක් තුළ ඉටුකරගත් දෑ

10.1 සංචාරක ක්ෂේත්‍රයේ ආයෝජන

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ආයෝජන සබඳතා ඒකකය ශ්‍රී ලංකාවේ සංචාරක ක්ෂේත්‍රයේ ආයෝජන සඳහා කේන්ද්‍රීය පහසුකම් සපයන මධ්‍යස්ථානයකි. සංචාරක ආයෝජකයින් සහ ශ්‍රී ලංකා රජය අතර සම්බන්ධතා ඇති එකම ස්ථානයද මෙයයි. මෙය පහසු, කරදරයකින් තොර, වගකිවයුතු සම්බන්ධතා ස්ථානයක් සඳහා ඉඩ සලසයි. එමගින් ආයෝජකයා කෙරෙහි වන විශ්වාසයද ගොඩනංවයි.




සටහන 1

2010 ඔක්තෝම්බර් මාසයේ සිට 2019 දෙසැම්බර් 31 දක්වා ආයෝජක සබඳතා ඒකකය විසින් සංචාරක ආයෝජන ව්‍යාපෘති 809 ක් ක්‍රියාත්මක කර ඇති අතර සමස්ත ආයෝජන වටිනාකම ඇමරිකානු ඩොලර් 6305.57 ක් වන අතර ඒ පිළිබඳ විස්තර පහත රූප සටහන 1 මගින් සහ 1 වගුවේ දක්වා ඇත.

| | 2011 | 2012 | 2013 | 2014 | 2015 | 2016 | 2017 | 2018 | 2019 |
|---|---|---|---|---|---|---|---|---|---|
| ව්‍යාපෘති සංඛ්‍යාව | 206 | 242 | 298 | 363 | 413 | 451 | 539 | 677 | 809 |
| කාමර ප්‍රමාණය | 13,132 | 15,581 | 19,839 | 23,340 | 26,483 | 27,512 | 29,946 | 33,817 | 36,533 |
| ආයෝජනය US $/(මි) | 2,011.32 | 2,384.90 | 3,492.27 | 4,399.01 | 4,818.27 | 4,983.27 | 5,190.66 | 6,116.99 | 6,305.57 |

වගුව 1

ඉහත සඳහන් සංචාරක ව්‍යාපෘති 809 හි සමුච්චිත සංඛ්‍යා අතුරින් ව්‍යාපෘති 407 ක් අවසාන අනුමත කිරීම් සහිතව ඇමරිකානු ඩොලර් මිලියන 3157.5 ක මුළු ආයෝජන වටිනාකමක් උසුලයි. මේ සමගින් රටේ සංචාරකයින් සඳහා වන කාමර ලැයිස්තුවට තවත් කාමර 20,286 කින් දායක වීමට ක්ෂේත්‍රයට හැකිව තිබේ.

මෙම ව්‍යාපෘති 407 හි සාරාංශය වගුව 2 සහ රූප සටහන 2 හි දැක්වේ.




| ව්‍යාපෘතිවල වත්මන් තත්වය | ව්‍යාපෘති සංඛ්‍යාව | කාමර ප්‍රමාණය | ආයෝජනය ඇ.ඩො (මි) |
|---|---|---|---|
| **ඉදිවෙමින් පවතින** | 121 | 7168 | 985.79 |
| **ආරම්භ නොවූ** | 76 | 2,858 | 396.86 |
| **ක්‍රියාත්මකව පවතින** | 210 | 10,260 | 1,774.85 |
| **සමස්තය** | 407 | 20,286 | 3,157.50 |

වගුව 2

ඉහත වගු සහ රූප සටහන්වලින් පැහැදිලිව පිළිබිඹු වන පරිදි, 2019 පාස්කු ඉරුදින ත්‍රස්ත ප්‍රහාරයෙන් ශ්‍රී ලංකා සංචාරක කර්මාන්තයට බලවත් පහරක් එල්ල වී තිබුණ ද, සංචාරක ආයෝජන ව්‍යාපෘති සඳහා පහසුකම් සැලසීමේ දී ආයෝජක සබඳතා ඒකකය පූර්වෝක්ත වර්ෂවල පැවැති වර්ධනය එලෙස ම රඳවා තබා ගැනීමට සමත් විය. වසර ඇතුළත සංචාරක ව්‍යාපෘති 132 ක් ආයෝජක සබඳතා ඒකකය වෙත ලැබී ඇති අතර කාමර 2716 ක් ඇති අතර එහි වටිනාකම ඇමරිකානු ඩොලර් මිලියන 188.58 කි. ආයෝජක සබඳතා ඒකකය විසින් අදාළ සියලු ම රේඛීය නියෝජිතායතන හා එක්ව, එක් එක් ව්‍යාපෘති ස්ථාන වෙත සාර්ථක ස්ථානීය පරීක්ෂණ චාරිකා පිළිබඳ කටයුතු සංවිධානය කරනු ලැබීමෙන් අනතුරුව, වර්ෂය මුළුල්ලේ පවත්වන ලද විෂය කමිටු රැස්වීම් දහයක දී මෙකී අයදුම්පත් ඇගයීමට ලක් කරන ලදී.



2 රූප සටහන: 2019 දී IRU විසින් සංවිධානය කරන ලද ඒකාබද්ධ පරීක්ෂණ චාරිකා



සංචාරක ව්‍යාපෘති ඇගයීම සඳහා ආයෝජක සබඳතා ඒකකය විසින් සංවිධානය කරන ලද විෂය කමිටු රැස්වීම්

## අ. රේඛීය නියෝජිතායතනවල නිලධාරීන් සඳහා පුහුණු සැසිවාර

2019 මාර්තු 14 වන දින කොළඹ මූවන්පික් (Movenpick) හෝටලයේ දී විවිධ නියෝජිතායතන රැසක ව්‍යාපෘති මෙහෙයවන නිලධාරීන් හට පුහුණු සැසියක් සංවිධානය කරන ලදි. USAID SAIL ව්‍යාපෘතිය මෙම වැඩමුළුව සඳහා තාක්ෂණික සහාය ලබා දුන්නේ ය.




රේඛීය නියෝජිත නිලධාරීන් සඳහා පුහුණු සැසි

## ආ. ආයෝජකයින් සඳහා පහසුකම් සැලසීමේ ක්‍රියාවලිය විධිමත් කිරීම

ශ්‍රී ලංකාවේ සංචාරක ක්ෂේත්‍රය වැඩිදියුණු කිරීම සඳහා ආයෝජක අනුමැතිය විධිමත් කිරීම සහ ආයෝජක සබඳතා ඒකකය විසින් සපයනු ලබන සේවාවන් සඳහා පහසුකම් සැලසීමේ අරමුණෙන් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් ව්‍යාපෘති ක්‍රියාවලිය ප්‍රතිඉංජිනේරුකරණය කිරීමේ ක්‍රියාවලියක් මූලාරම්භ කරන ලදි. මෙම ක්‍රියාවලියේ පරමාර්ථය වනුයේ මෙම අංශය තුළ ආයෝජකයින්ට අවශ්‍ය නිවැරදි හා විශ්වාසදායක තොරතුරු සැපයීම සහ අවම කාල සීමාව තුළ අදාළ සියලු රාජ්‍ය ආයතනවල අනුමැතිය සඳහා සරල ආකාරයකින් පහසුකම් සැලසීමයි.

USAID-SAIL ව්‍යාපෘතිය මෙම ප්‍රයත්නය සඳහා අවශ්‍ය විශේෂඥ දැනුම හා තාක්ෂණික සහාය ලබා දුන් අතර 2019 දී SLTDA විසින් නාගරික සංවර්ධන අධිකාරිය සමග අවබෝධතා ගිවිසුමක් අත්සන් කරමින් මෙම ක්‍රියාවලිය ආරම්භ කළ අතර වෙරළ සංරක්ෂණ අධිකාරිය හා තවත් අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීමද සිදු කෙරිණි. ශ්‍රී ලංකාවේ ප්‍රධාන ව්‍යාපෘති අනුමත කරන නියෝජිතායතන අතුරින් එක් ප්‍රධාන ආයතනයක් වන වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව හා තවත් අවබෝධතා ගිවිසුමක් අත්සන් තැබීය.




අවබෝධතා ගිවිසුමට අත්සන් තැබීම

මෙම උත්සවය 2019 නොවැම්බර් 8 වන දින කොළඹ දී පැවැත්වුණු අතර, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ සභාපති ජොහෑන් ජයරත්න මහතා සහ, වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ප්‍රභාත් චන්ද්‍රකීර්ති මහතා එම සංවිධාන දෙක නියෝජනය කරමින් අවබෝධතා ගිවිසුමට අත්සන් තැබූහ.

සමස්ත ව්‍යාපෘති අනුමත කිරීමේ ක්‍රියාවලියේ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමට මෙන්ම, සහයෝගීතාව පුළුල් කිරීම සහ සාමූහිකව වැඩ කිරීම සඳහා අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීම සම්බන්ධයෙන් ආයෝජක සබඳතා ඒකකය අනෙකුත් ප්‍රධාන ව්‍යාපෘති අනුමත කරන ආයතන සමග සංවාදයක් ආරම්භ කළේය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, ශ්‍රී ලංකා මධ්‍යම පරිසර අධිකාරිය, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය, කොළඹ මහනගර සභාව, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, වාරිමාර්ග දෙපාර්තමේන්තුව සහ ගොවිජන සේවා දෙපාර්තමේතුව වැනි රේඛීය නියෝජිතායතන ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය සමග අනාගතයේ දී අවබෝධතා ගිවිසුම්වලට එළැඹීමට අපේක්ෂා කරයි.

### ඇ. රේඛීය නියෝජිතායතනවල ප්‍රධානීන් සහ ජ්‍යේෂ්ඨ නිලධාරීන්ගේ ජාලක සම්බන්ධක හමුව

නියෝජිතායතන සහ ඔවුන්ගේ කළමනාකරණ ප්‍රධානීන් අතර ජාලක සම්බන්ධතා ප්‍රවර්ධනය කිරීමට සහ සහයෝගීතාව ශක්තිමත් කිරීමේ අරමුණ පෙරදැරිව සියලු ම නියෝජිත ආයතනවල සභාපතිවරු, අධ්‍යක්ෂ ජෙනරාල්වරු මෙන්ම ජ්‍යේෂ්ඨ නිලධාරීන් උදෙසා 2019 නොවැම්බර් මස 05 වන දින බත්තරමුල්ල වෝටර්ස් එජ් හි දී ජාලක සම්බන්ධක හමුවක් සංවිධානය කරන ලදී.




නිලධාරීන්ගේ හමුව

### ඈ. සංචාරක සැලසුම්කරණ, සංවර්ධන, සහ ආයෝජක සබඳතා ඒකකය යන අංශවල කාර්යය මණ්ඩලය සඳහා පුහුණු සැසි මාලාවක්

ආයෝජකයින් සහ බලධාරීන් අතර පහසුකම් සපයන්නන් ලෙස ක්‍රියා කිරීම සඳහා පුද්ගල හා අන්තර් ක්‍රියාකාරීත්ව කුසලතා මෙන්ම කාර්ය මණ්ඩලයේ අවශ්‍ය දැනුම වැඩි දියුණු කිරීමේ අරමුණින් 2019 වසරේදී පුහුණු සැසි මාලාවක් ආරම්භ කරන ලදී. එහි පළමු අභ්‍යන්තර පුහුණු සැසිය දෙසැම්බර් 09 දින ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ දී පැවැත්විණි. 2020 වසර දක්වා අඛණ්ඩව පැවැත්වෙන මෙම පුහුණු සැසි USAID SAIL ව්‍යාපෘතියේ කොටසක් වන අතර ආයෝජක සබඳතා ඒකකයෙහි ආයෝජන ව්‍යාපෘති ආශ්‍රිත ක්‍රියාකාරකම් පිළිබඳ පැහැදිලි මඟ පෙන්වීමක් සහ සුදුසු දැනුමක් ඇතිව කටයුතු කිරීමට කාර්ය මණ්ඩලයට සහාය වීම මෙහි අරමුණ විණි.



පුහුණු සැසියක්

### ඉ. ප්‍රධාන ව්‍යාපෘතිවල ඉදිකිරීම් අදියරේ දී සිදු කළ අධීක්ෂණ චාරිකා

එහි පළමු අධීක්ෂණ චාරිකාව සංවිධානය කරන ලද්දේ 2019 දෙසැම්බර් 20 වන දින ජලාශ්‍රිත නගර ඒකාබද්ධ ව්‍යාපෘතියේ ඉදිකිරීම් ස්ථානය (ජෝන් කීල්ස් සිටි ව්‍යාපෘතිය) වෙත ය. ඉදිකිරීම් අදියරේ පවතින සංචාරක ව්‍යාපෘති පිළිබඳ ප්‍රායෝගික පුහුණු අවස්ථා සහ තාක්ෂණික දැනුම ලබා දීමේ අරමුණ ඇතිව සංචාරක සැලසුම්කරණ, සංවර්ධන, සහ ආයෝජක සබඳතා ඒකකය යනාදී අංශවල කාර්යය මණ්ඩලය වෙත 2019 වර්ෂයේ දී ප්‍රධාන ව්‍යාපෘති වෙත සිදු කරන අධීක්ෂණ චාරිකා නමින් වෙනම විශේෂ මූලාරම්භයක් හඳුන්වා දෙන ලදී.



අධීක්ෂණ චාරිකාව

## 10.2 යටිතල පහසුකම් සංවර්ධනය

මේ වන විට ව්‍යාපෘති කිහිපයක් ම දිවයින පුරා ක්‍රියාත්මක වෙමින් පවතින අතර එය අවසන් වූ විට පවතින යටිතල පහසුකම් වැඩි දියුණු කිරීමට පියවර ගැනේ. මෙම ව්‍යාපෘති වලින් ඇතැම් ව්‍යාපෘතීන්හි දැනටමත් ඉදිකිරීම් ආරම්භ වී ඇති අතර, ඇතැම් ඒවා අනුමත කිරීමේ අදියරේ පවතී. එමෙන්ම, දැනට සැලසුම් කිරීමේ අදියරේ පවතින ව්‍යාපෘති මෙන්ම, වැඩ අවසන් අදියරේ ව්‍යාපෘතිද වෙයි.

### 1. කල්පිටිය දූපත් නිකේතනය

කල්පිටිය ඒකාබද්ධ සංචාරක ව්‍යාපෘතිය ශ්‍රී ලංකාවට "කල්පිටිය දූපත් නිකේතනය" නමින් නවතම සංකල්පයක් හඳුන්වා දීමට පියවර ගෙන තිබේ. මෙම ව්‍යාපෘතිය යටතේ දූපත් 12ක් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියට පවරා දෙන ලදි. දූපත් වටා ඇති සංවේදී පාරිසරික කලාපවලට අවම බලපෑමක් ඇති වන පරිදි සංවර්ධනයේ උච්චතම සීමාව හඳුනාගත් පුළුල් උපාය මාර්ගික පාරිසරික අධ්‍යයනයක් සිදු කිරීමෙන් අනතුරුව, අධිකාරිය මගින් සංවර්ධනය කිරීම සඳහා අක්කර 5000 ක භූමි ප්‍රමාණයක් හඳුනා ගැනිණි. කාමර 4000 ක් නිම කිරීම මූලික ඉලක්කය වන අතර එමගින් සෘජු රැකියා අවස්ථා 15,000-18,000 ක් නිර්මාණය වේ. මේ වන විට දූපත් 4 ක් ආයෝජකයින් දෙදෙනෙකු සඳහා බදු දී ඇති අතර තවත් ආයෝජක ව්‍යාපෘති 4 ක් අනුමත කිරීමේ අවසන් අදියරේ පවතී. එමෙන්ම, තවත් දූපත් 4 ක් ව්‍යාපෘති සඳහා බදු දී ඇත.

2019 වර්ෂය තුළ සංවර්ධනයේ ප්‍රගතිය පහත පරිදිය:

**වෙල්ලායි I, II, සහ III, දූපත් (ආයෝජකයා - සන් රිසෝර්ට් ලංකා පුද්ගලික සමාගම)**

වෙල්ලායි I, II, සහ III, දූපත් සඳහා ලැබුණු ආයෝජක යෝජනාව සඳහා අනුමතිය ලැබිණි. සංවර්ධනයේ ප්‍රධාන අංගයක් ලෙසින් ජලය ආශ්‍රිතව ඉදි කෙරෙන බංගලා සැලකේ. පළමුවෙන්ම ඒ සඳහා භාවිත කරන භූමිය සංවර්ධනය කරන ලෙස ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය ආයෝජකයින්ගෙන් ඉල්ලා සිටියද, ආයෝජකයා අවධාරණය කළේ මෙම බංගලා සඳහා පූර්ණ අනුමැතිය ලබා ගත යුතු බවත් එවිට සම්පූර්ණ සංවර්ධනය එකවරම ආරම්භ කළ හැකි බවත්ය. ජලය ආශ්‍රිතව ඉදිකර ඇති සුවිශේෂී බංගලා සහිත නවාතැන් පහසුකම් සංවර්ධනයෙහි එක් ප්‍රධාන අංශයක් වේ. කෙසේ වෙතත්, අධිකාරිය තවමත් මුහුදු පතුල පිළිබඳ අවසන් අනුමැතිය බලාපොරොත්තුවෙන් සිටින අතර එතෙක් සංවර්ධනය ඉදිරියට යා නොහැකි වී තිබේ.

**ඉපන්තිව් දූපත් (ආයෝජකයා - කියුබ් ලංකා ලෙෂර් පුද්ගලික සමාගම)**

ආයෝජන යෝජනාව අනුමත කිරීමෙන් පසු මෙම ව්‍යාපෘතියට ධීවර ප්‍රජාවෙන් යම් විරෝධයක් එල්ල වූ අතර ඔවුන්ගේ එදිනෙදා කටයුතුවලට බාධා ඇති වන බව පැවසිනි. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය ආගමික නායකයින් සහ අනෙකුත් රජයේ නිලධාරීන් සමඟ එක්ව ධීවර ප්‍රජාව සමඟ සාකච්ඡා කිහිපයක් පැවැත්වූ අතර එම විසඳුම සමඟ එකඟ නොවූ ආයෝජකයාට විසඳුමක් යෝජනා කරන ලද අතර දැනට කල්පිටිය කලපුවේ සිට විකල්ප ඉඩමක් හෝ දූපතක් ඉල්ලා ඇත.

**අනුමත කිරීමේ අවසන් අදියර කිහිපය:**

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, කල්පිටිය ව්‍යාපෘති ප්‍රදේශයේ ඉතිරිව ඇති ඇතැම් සංචාරක ව්‍යාපෘතිවල ආයෝජනය කිරීමට විභවතාවක් සහිත ආයෝජකයන්ගෙන් 2019 ජූලි මාසයේ දී සහ යළි 2019 ඔක්තෝබර් මාසයේ දී පුවත්පත් දැන්වීම් මගින් තවදුරටත් යෝජනා කැඳෙව්වේ ය.

**පළමු අදියර:** 2019 ජූලි 21 වන දින දැන්වීම් මගින් යෝජනා කැඳවනු ලැබුණු අතර, අක්කර 10 ක භූමි ප්‍රමාණයකට එක් ආයෝජක යෝජනාවක් ලැබුණේ ජල ක්‍රීඩාව ප්‍රවර්ධනය කිරීම පිණිස සුඛෝපභෝගී විලා 50 ක් ඉදි කිරීම සඳහාය. ඒ සඳහා වැයවන ඇස්තමේන්තුගත වියදම රු. මිලියන 750 කි. තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශය මත ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ එම ව්‍යාපෘතිය සඳහා එක් දූපතක් බදු දීමට අනුමැතිය ලබා දී ඇති අතර, සංචාරක අමාත්‍යවරයාගේ අනුමැතිය අපේක්ෂාවෙන් ඉඩම් වෙන් කිරීමේ අවසන් අදියරේ කටයුතු මේ වන විට සිදු වෙමින් පවතී.

**දෙවන අදියර:** 2019 ඔක්තෝබර් 4 සහ 13 ඔක්තෝබර් 13 දින පුවත්පත් දැන්වීම් මගින් කැඳවන ලද තවත් යෝජනා යෝජනා දෙකක් ලැබුණි.

(a) සින්න අරච්චලෙයි දූපත (අක්කර 41.56) - ඇමරිකානු ඩොලර් මිලියන 5.1 ක ආයෝජනයක් යටතේ සුඛෝපභෝගී කාමර 50 ක් ඉදිකිරීම.

(b) උච්චමුණි දූපත (හෙක්ටයාර 449.3) - කාමර 200 කින් යුත් තරු හයක රිසෝට් හෝටලයක්, සුඛෝපභෝගී විලා 300 කින් යුත් තරු පහේ හෝටලයක්, ඇඳන් 50 ක රෝහලක් සහ ඊට සම්බන්ධ ප්‍රජා සංවර්ධන ව්‍යාපෘති ඇතුළත් බහු ක්‍රියාකාරී සුඛෝපභෝගී දූපතක් සංවර්ධනය කිරීම, මෙම යෝජනාවට ඇතුළත් විණි. ඒ සඳහා වැයවන ඇස්තමේන්තුගත ආයෝජන වටිනාකම ඇමරිකානු ඩොලර් මිලියන 417.5 කි.

තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශය සහ ප්‍රසම්පාදන කමිටුවේ අනුමතිය මත පදනම්ව, මෙම ආයෝජන ව්‍යාපෘති දෙකම තවදුරටත් ඉදිරියට ක්‍රියාවට නැංවීම සඳහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ කළමණාකාරිත්ව මණ්ඩලයේ අනුමැතිය බලාපොරොත්තුවෙන් සිටී.

කල්පිටිය දූපත් නිකේතනයේ "සින්න ඉරුමතිව්" දූපත සඳහා සංචාරක අමාත්‍යාංශය හරහා ඉදිරිපත් කළ (පූර්වයේ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් සලකා බලන ලද සහ OCEM මගින් නිර්දේශිත) ආයෝජන ව්‍යාපෘතියක් කෙරෙහි ද ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ කළමනාකරණ මණ්ඩලය සිය අවධානය යොමු කළේ ය. ඒ අනුව, යෝජිත ව්‍යාපෘතිය සඳහා අක්කර 5.22 ක ඉඩමක් වෙන් කිරීමට කළමනාකරණ මණ්ඩලය විසින් අනුමැතිය ලබා දෙන ලදී. එම ව්‍යාපෘතියේ සමස්ත ඇස්තමේන්තු පිරිවැය මිලියන 125 කි. ඉඩම් වෙන් කිරීම හා බදු ගිවිසුම අත්සන් කිරීම සඳහා සංචාරක අමාත්‍යවරයාගේ අවසන් අනුමැතිය ලබා ගත යුතුය.

තවද, කල්පිටියේ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ඉදිකිරීම් වැඩබිම් කාර්යාලය සැලසුම් කිරීමේ ටෙන්ඩර් ලියවිලි සකස් කිරීම හා අධීක්ෂණය සඳහා 2019 වර්ෂයේ දී උපදේශන සමාගමක් වන M/S විජේරත්න ඇසෝසියේට් සමාගම වෙත පවරා ඇත. එම සැලසුම් සකස් කිරීම දැනට සිදුවෙමින් පවතී.

## 2. **කුච්චවෙලි බීච් රිසෝට්**

නැගෙනහිර කලාපයේ ඇති සුවිශේෂී ආකර්ෂණීය ස්ථාන සමග කුච්චවේලි බීච් රිසෝට් ව්‍යාපෘතිය මගින් ඉහළම සංචාරක පැතිකඩක් ප්‍රදර්ශනය කිරීමට හා ආකර්ෂණය කර ගැනීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු වී තිබේ. මෙම උත්සාහය මගින් අවට ප්‍රදේශයේ කලාපීය සංවර්ධනය වේගවත් කරනු ඇත. ඉලක්ක කර ඇති ව්‍යාපෘති ප්‍රදේශය, අක්කර 386 ක වෙරළ තීරය මෙන්ම, ප්‍රධාන මාර්ගය හා ඉරාක්කන්ඩි පාලම සහ සලාපයාරු පාලම අතර විහිදේ. මාර්ග, විදුලිය සහ ජල සැපයුම වැනි යටිතල පහසුකම් තිබීම ආයෝජකයින්ට දිරිගැන්වීමක් වන අතර, එහි ප්‍රතිඵලයක් වශයෙන්, මෙම ප්‍රදේශයේ සංවර්ධනය සඳහා අනාගත ආයෝජන පිරිනැමීම සහ යෝජනා සම්බන්ධයෙන් ඉහළ අපේක්ෂා දල්වා ගත හැකි වේ.

2019 වසර වන විට සංවර්ධනය කිරීමට ආයෝජකයින් දෙදෙනෙකුට අක්කර තිස්පහක (අක්කර 35) මුළු භූමි ප්‍රමාණයක් ද ලබා දී ඇත.

(අ) උගා ජංගල් බීච් රිසෝට් (පුද්) සමාගම - (අක්කර 15)
මෙම නිකේතනය දැනටමත් සංවර්ධනය කර ඇති අතර එය දැනට සංචාරකයින් සඳහා විවෘතය.

(ආ) Mfar හොටෙල් ඇන්ඩ් රිසෝට්ස් සමාගම - (අක්කර 20)

අවශ්‍ය පූර්ව ගෙවීම් සිදුකර තිබියදීත් Mfar හොටෙල් ඇන්ඩ් රිසෝට්ස් සමාගමට ඉදිකිරීම් ආරම්භ කිරීමට නොහැකි විය. SLTDA විසින් විකල්ප 2 ක් Mfar වෙත යොමු කර ඇත. එනම්:

i) ආයෝජකයාගේ පාර්ශ්වයෙන් සිදු වූ දෝෂය සහ බදු ගිවිසුම කඩ කිරීම නොතකා, ඉල්ලුම් කරන ලද දීර්ඝ කිරීම 2019 දක්වා පිළිගැනීම,

ii) බදු ගිවිසුම අවලංගු කර විකල්ප ආයෝජන ව්‍යාපෘතියකට ඉඩම වෙන් කිරීම.

කෙසේ වෙතත් ඉහත කරුණු සම්බන්ධයෙන් 2019 වසරේදී තීරණයක් නොගත් අතර, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියට අවසාන තීරණය ලබාගෙන 2020 දී ඒ අනුව ඉදිරියට යා යුතුය.

කුච්චවේලි බීච් රිසෝට් හි අක්කර 3 සිට 7 දක්වා (එක් ආයෝජකයෙකුට) ආයෝජනය කිරීමට අනාගත ආයෝජකයින් -ගෙන් 2019 දී ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය යෝජනා කළේය. වර්ෂය තුළ අදියර දෙකකින් පුවත්පත් දැන්වීම් මගින් යෝජනා ඉදිරිපත් කිරීමට ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය ඉල්ලා සිටියේය.

**පළමු අදියර: 2019 ජුලි 21 දින යෝජනා කැඳවූ අතර ඒ අනුව, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියට යෝජනා තුනක් ලැබුණි.**

(අ) අක්කර 7 ක ඉඩමක ජල ක්‍රීඩා හා ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම සඳහා සුඛෝපභෝගී විලා 50 ක් ඉදිකිරීම සඳහා රු. මිලියන 1,000 ක ආයෝජනයක්.

(ආ) ඇමරිකානු ඩොලර් මිලියන 15ක ඇස්තමේන්තුගත ආයෝජනයකින් අදියර දෙකක් යටතේ ඉදි කිරීමට නියමිත කාමර 150කින් යුත් සුඛෝපභෝගී හෝටලයක් ඉදිකිරීම සඳහා අක්කර 14ක භූමි ප්‍රමාණයක්.

(ඇ) රුපියල් මිලියන 320ක ඇස්තමේන්තුගත ආයෝජන සහිත කාමර 20කින් සමන්විත ගොල්ෆ් නවාතැනක් සහ සම්බාහන මධ්‍යස්ථානයක් සඳහා අක්කර 10ක භූමි ප්‍රදේශයක්.

තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශය මත කළමනාකරණ මණ්ඩලය ඉහත ආයෝජකයින් තිදෙනා වෙනුවෙන් ඉඩම් බදු දීමට ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය අනුමැතිය ලබා දී තිබේ. එම ඉඩම් වෙන් කිරීම සඳහා සංචාරක අමාත්‍යවරයාගේ අනුමැතිය අපේක්ෂිතය.

**දෙවන අදියර: 2019 දී ඔක්තෝබර් 4 සහ ඔක්තෝබර් 13 යන දිනවල පුවත්පත් දැන්වීම් මගින් යෝජනා කැඳවනු ලැබූ අතර ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියට යෝජනා හතරක් ලැබුණි.**

(a) ඇමරිකානු ඩොලර් මිලියන 9 ක ඇස්තමේන්තුගත ආයෝජනයක් යටතේ අක්කර 10 ක භූමි ප්‍රමාණයක කාමර 100-120 කින් යුත් සුඛෝපභෝගී හෝටලයක් ඉදිකිරීම.

(b) අක්කර 10 ක භූමි ප්‍රමාණයක රු.මිලියන 90 ක ආයෝජනයකින්, කාමර 30 කින් යුත් නිවාඩු නිකේතනයක් ඉදි කිරීම.

(c) රු.මිලියන 90 ක ආයෝජනයක් ලෙසින් අක්කර 6 ක භූමි ප්‍රමාණයක කාමර 30 කින් යුත් යෝග නිකේතනයක් ඉදි කිරීම.

(d) අක්කර 10 ක භූමි ප්‍රමාණයක කුටි 105 කින් යුත් සුඛෝපභෝගී ආයුර්වේද නිකේතනයක් ඉදි කිරීම. අදියර 2 කින් මෙය නිම කිරීමට නියමිත අතර ආයෝජන වටිනාකම රු. මිලියන 780 කි.

තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශය සහ ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය මත පදනම්ව, ඉහත (1) ව්‍යාපෘතිය තවදුරටත් ඉදිරියට යාම සඳහා SLTDA අනුමැති අපේක්ෂාවෙන් සිටින අතර අනෙක් ආයෝජන ව්‍යාපෘති, 3 සහ 4 නැවත ඇගයීම සඳහා ආයෝජකයින්ගේ සහභාගීත්වය ඇතිව වෙනත් ඉදිරිපත් කිරීමක් සඳහා නිර්දේශ කරන ලදී.

මෙයට අමතරව, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය කුච්චවේලි බීච් රිසෝට් හි ප්‍රධාන සැලැස්ම සකස් කිරීම සඳහා කැනෝපස් පුද්ගලික සමාගම වෙත 2019 ඔක්තෝබර් හි දී කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කළ අතර ඒ පිළිබඳ වැඩකටයුතු දැනටමත් ආරම්භ කර ඇත. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය වෙත අතුරු වාර්තාවක් ඉදිරිපත් කරන ලද අතර අවසන් වාර්තාව මේ වන විට සැකසෙමින් පවතියි.

තවදුරටත්, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය කුච්චවේලි හි ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ඉදිකිරීම් වැඩබිම් කාර්යාලයේ සැලසුම් කටයුතු, ටෙන්ඩර් ලිපිලේඛන සකස් කිරීමේ කටයුතු සහ අධීක්ෂණ කටයුතු සඳහා විජේරත්න ඇසෝසියේට්ස් වෙත 2019 ඔක්තෝබර් 22 වන දින කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කළේ ය.

### 3. යාල වයිල්ඩ් රිසෝට් හි සංවර්ධනය

පලටුපාන යනු යාල ජාතික වනෝද්‍යානයට අයත් බිම් ප්‍රදේශයකි. මෙම උද්‍යානය කුමන, බූන්දල, වීරවිල සහ ලුනුගම්වෙහෙර, යන අභයභූමි ගණනාවකින් වටවී ඇත. මේවා වනජීවීන් සඳහා කැපවූ තීරණාත්මක ප්‍රදේශ ලෙස හඳුනාගෙන වෙන් කර ඇත යාල යනු ශ්‍රී ලංකාවේ වැඩිපුරම නැරඹූ හා දෙවන විශාලතම ජාතික වනෝද්‍යානය වන අතර එය 1900 සිට වනජීවී අභයභූමියක් ලෙස නම් කර තිබේ. ඉන්දියානු සාගරයට එක් පැත්තකින් මායිම්ව පිහිටා ඇති මෙය රටේ ගිනිකොන දෙසින් කි.මී. 300 ක් (සැතපුම් 190) කොළඹ සිට. එය දකුණු පළාතේ මායිමේ පිහිටා ඇති අතර වර්ග කිලෝමීටර් 979 ක් (වර්ග සැතපුම් 378) ආවරණය වන පරිදි නැගෙනහිර පළාතේ ආරම්භය දක්වා විහිදේ. පලටුපාන කලාපය අක්කර 1170 ක් පමණ වන අතර වනගත නිකේතනයක් සඳහා යෝජනා විණි. කතරගම සහ සිතුල්පව්ව වැනි වැදගත් ස්ථානවලට පිවිසීමට උත්සාහ කරන බැතිමතුන්ට මෙම ස්ථානය වැදගත් ස්ථානයකි.

2019 වර්ෂයේ ව්‍යාපෘති අත් කරගත් වර්ධන පහත දැක්වේ.:

| නො. | ක්‍රියාකාරකම් /ව්‍යාපෘති | 2019 දක්වා ප්‍රගතිය |
|---|---|---|
| 01. | පුද්ගලික ආයෝජන ව්‍යාපෘති | ප්‍රධාන සැලැස්මට අනුව සංචාරක ආයෝජන ව්‍යාපෘති සඳහා ඉඩම් ප්‍රදේශ 7 ක් වෙන් කිරීම් අනුමත කරන ලදී. අනාගතයේදී යාල වයිල්ඩ් රිසෝට් සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක වන බව සහතික කිරීම සඳහා අවශ්‍ය පියවර ගනිමින් SLTDA වත්මන් හා නව ආයෝජකයින් සමඟ කටයුතු කරයි. |
| 02. | විදුලිබල සැපයුම | විදුලිබල සැපයුම සඳහා ලං.වි.ම මගින් විදුලි සැපයුම් කණු සහ කේබල් සවි කෙරිණි. |
| 03. | යාල වයිල්ඩ් රිසෝට් හි සඳහා සංකල්පීය ප්‍රධාන සැලැස්ම සකස් කිරීම | සම්පූර්ණයි |
| 04. | යාල වයිල්ඩ් රිසෝට් හි ක්ෂේත්‍ර කාර්යාල ගොඩනැගිල්ලක් ඉදිකිරීම | ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ක්ෂේත්‍ර කාර්යාලය පිහිටුවීම සැලසුම් කිරීම, ටෙන්ඩර් ලේඛන සකස් කිරීම සහ අධීක්ෂණය කිරීම සඳහා උපදේශන සමාගමට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කෙරිණි. සැලසුම් කටයුතු එහි අවසන් අදියරේ පවතී. |

**යාල සංචාරක ආයෝජන ව්‍යාපෘතිය සම්බන්ධ සාරාංශය.**

වෙන් කරන ලද ඉඩම් හතෙන් ව්‍යාපෘති දෙකක් 2019 ආරම්භයේදී ක්‍රියාත්මක විය (අයිසීසී රිසෝට්ස් පුද්ගලික සමාගම - උගා වෙනා හට්ස් සහ වයිල්ඩ් කෝස්ට් ලොජ් පුද්ගලික සමාගම ලෙසද හැඳින්වේ). 2019 දී ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ කළමනාකරණ මණ්ඩලය විසින් හෝටල් පුළුල් කිරීම සඳහා මෙම නිකේතන දෙකේ කළමනාකාරිත්වය විසින් කරන ලද ඉල්ලීම් සලකා බැලූ අතර පහත විස්තර අනුව ඔවුන්ට තවත් ඉඩම් ප්‍රදේශ වෙන් කර බදු දීමට අනුමැතිය ලබා දෙන ලදී.

| නො. | ආයෝජකයාගේ නම | ඉඩම් ප්‍රමාණය |
|---|---|---|
| 01. | වයිල්ඩ් කෝස්ට් ලොජ් පුද්ගලික සමාගම | අක්කර 0.96 |
| 02. | අයිසීසී රිසෝට්ස් පුද්ගලික සමාගම | අක්කර 1.8 |

සංචාරක අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීමෙන් පසු අවසාන ඉඩම් වෙන් කිරීම සහ බදු ගිවිසුම් අත්සන් කිරීම සිදුවනු ඇත.

වෙන් කර ඇති අනෙක් ඉඩම් අතුරින් ආයෝජන ව්‍යාපෘති තුනක් දැනටමත් ආරම්භ කර ඇති අතර ඒවා ඉදිකිරීම්වල විවිධ අදියරයන්හි පවතින අතර ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් ඉඩම් බදු දීම සහ සංචාරක කටයුතු ආරම්භ කිරීම සඳහා අවශ්‍ය පියවර 2019 දී ආරම්භ කර තිබේ. ව්‍යාපෘතිය ඉදිරියට පවත්වාගෙන යාම සඳහා අනෙක් ඉඩම් දෙක සඳහා  සංචාරක අමාත්‍යවරයාගේ අනුමැතිය බලාපොරොත්තුවෙන් සිටී.

**යාල වයිල්ඩ් රිසෝට් - ක්‍රියාකාරී නිකේතන**




**යාල වයිල්ඩ් රිසෝට් - ඉදිකිරීම් යටතේ ඇති ව්‍යාපෘති**




**යාල වයිල්ඩ් රිසෝට් - වෙනත් වැඩ**

අධික වර්ෂාව හේතුවෙන් සැලසුම් කර ඇති පරිදි 2019 යේ සිව්වන කාර්තුවේදී පොදු පිවිසුම් මාර්ගය නඩත්තු කිරීමේ ප්‍රගතිය ඉදිරියට යා නොහැකි විය. කෙසේ වෙතත්, 2019 අවසන් වන විට මාර්ග අලුත්වැඩියාව සහ නඩත්තු කටයුතු සිදු කිරීම සඳහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කළේය.

2019 ඔක්තෝම්බර් මාසයේදී ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය මගින් විජරත්න ඇසෝසියේට්ස් වෙත ප්‍රවේශ සැලසුම සහ සැලසුම සකස් කිරීම සඳහා කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කෙරිණි.

යාල වයිල්ඩ් නිවාඩු නිකේතනයේ පොදු පිවිසුම් මාර්ගය දිගේ ගස් සිටුවීම සඳහා සුදුසු පාර්ශවය තෝරා ගැනීම සහ පරිසරයට සුදුසු වන පරිදි විදුලි කණු සවි කිරීම ප්‍රසම්පාදන මට්ටමේ පැවති අතර තාක්ෂණික කමිටු ඇගයීම 2019 වසර අවසන් වන විට ක්‍රියාත්මක විය. යාල වයිල්ඩ් නිවාඩු නිකේතනයේ SLTDA නාම පුවරු ස්ථාපනය ද 2019 දී අවසන් කරන ලදී.

### 4. දෙද්දුව ලේක් රිසෝට්

දෙද්දුව බෙන්තොට නැගෙනහිර පැත්තේ පිහිටා ඇති අතර ජල කඳවල්, වගුරු බිම් සහ අතහැර දමා ඇති කුඹුරු-වලින් සමන්විත වේ. හඳුනාගත් මුළු භූමි ප්‍රමාණය අක්කර 1700 ක් වන අතර ජලය පදනම් කරගත් විනෝදාත්මක කටයුතු කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් ලේක් රිසෝට් එකක් ලෙසින් සංවර්ධනය කිරීමට යෝජනා කර ඇත.

**2019 අවසානය**

සම්පූර්ණ ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය අවසන් කර ඉඩම භාර දෙන ලදී. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය 2017 දෙසැම්බර් මාසයේදී ඇරඹූ, වෙරළ පිවිසුම් මාර්ගය අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය තවමත් ක්‍රියාත්මකයි. සංකල්පීය සැලැස්මක් සකස් කිරීම සහ අනුමත ලේඛන සකස් කිරීම සඳහා උපදේශකයෙකු බඳවා ගැනීමට 2019 දී කැබිනට් අනුමැතිය ලබා ගැණිනි. දැනට උපදේශක වරයෙකු බඳවා ගැනීම සඳහා එකඟතා ගිවිසුම් පිලියෙළ වෙමින් පවතී.

### 5. බෙන්තොට බීච් රිසෝට් ව්‍යාපෘතිය

බෙන්තොට බීච් රිසෝට් ව්‍යාපෘතිය 2019 වන විට ක්‍රියාත්මක අතර බොහෝ ඉඩම් පිළිගත් හෝටල් සහ සංචාරක නවාතැන් සේවා සපයන්නන්ට බදු දී ඇත.
2019 වර්ෂය තුළ:

- ප්‍රමාණවත් ධාරිතාවයක් සහ පවත්නා බලාගාරයේ ඇති ගැටලු හේතුවෙන් අපජල පවිත්‍රාගාරයක් විමර්ශනය කිරීම සඳහා උපදේශන සේවා සඳහා සුදුසු පාර්ශවයක් බඳවා ගැනීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කරන ලදී. දැනට, ක්‍රියාවලිය ඇගයීමේ අදියරේ පවතී. ඇගයීම හා තෝරා ගැනීමේ ක්‍රියාවලිය අවසන් වූ පසු, වැඩ ආරම්භ කිරීම සඳහා තෝරාගත් සමාගමට කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කෙරේ.

- මීට අමතරව, සංවර්ධන අරමුණු සඳහා බෙන්තොට ඉතිරිව ඇති ඉඩමෙහි අක්කර 2 සිට 3 දක්වා (එක් ආයෝජකයෙකුට) බිම් කැබලි සංචාරක ව්‍යාපෘතියකට ආයෝජනය කිරීමට අනාගත ආයෝජකයින්ගෙන් ද ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය ද යෝජනා ඉල්ලා සිටිනු ලැබීය. ඒ අදියර දෙකක් යටතේ පුවත්පත් දැන්වීම් මගිනි.

**පළමු අදියර:** 2019 ජූලි 21 වන දින පුවත්පත් දැන්වීම් මගින්, සුඛෝපභෝගී විලා 50 ක් සහිත අක්කර තුනක බිම් කැබැල්ලක් සංවර්ධනය කිරීමට රු. මිලියන 750 ක් වන අතර ජල ක්‍රීඩා සහ ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කරයි. ප්‍රසම්පාදන කමිටුව විසින් ඇගයීම හා නිර්දේශ කිරීම පිළිබඳ යෝජනාවට ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය අනුමැතිය ලබා දී ඇත. ඉඩම් වෙන් කිරීම සඳහා කල්බදු ගිවිසුම අත්සන් කිරීම අවසන් අදියරේ පවතින අතර සංචාරක අමාත්‍යවරයා අනුමැතිය අපේක්ෂාවෙන් පසු වේ.

**දෙවන අදියර:** 2019 දී ඔක්තෝබර් 4 සහ ඔක්තෝබර් 13 යන දිනවල පුවත්පත් දැන්වීම් මගින් යෝජනා කැඳවූ අතර පහත සඳහන් යෝජනා දෙක ලැබුණි.

(අ) කාමර 30 ක හෝටලයක් ඉදිකිරීම සඳහා අක්කර තුනක භූමි ප්‍රමාණය රු. මිලියන 450 කි.

(ආ) අක්කර 12 ක භූමි ප්‍රමාණයක ඇමරිකානු ඩොලර් මිලියන 35.8 ක ඇස්තමේන්තුගත ආයෝජනයක් සහිත සුඛෝපභෝගී විලා 36 ක් ඉදි කිරීම

තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශය සහ ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය මත පදනම්ව, ඉහත (අ) ව්‍යාපෘතිය තවදුරටත් පවත්වාගෙන යාම සඳහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය අනුමැතිය අපේක්ෂාවෙන් සිටින අතර අනෙක් ආයෝජන ව්‍යාපෘතිය (ආ) සහභාගීත්වයෙන් ඉදිරිපත් කිරීමක් සඳහා නිර්දේශ කර ඇත.

## නව ඉඩම්

### 1. මන්නාරම සහ යාපනයේ ඩෙල්ෆ්ට් දූපත.

පහත දැක්වෙන්නේ උතුරු කලාපයේ දැවැන්ත සංචාරක ව්‍යාපෘති සංවර්ධනය කිරීම සඳහා 2019 වර්ෂයේ දී ගෙන ඇති පියවරයන්ය.

- මන්නාරම සඳහා සුදුසු ඉඩම් ප්‍රදේශ හඳුනාගෙන ඇති අතර ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් හඳුනාගත් ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය ආරම්භ කිරීම සඳහා මිලියන 61 ක් වැය කර තිබේ.(මුළු වටිනාකමෙන් 25%)

- ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ නිලධාරීන් ප්‍රාදේශීය ලේකම්වරයා හා එක්ව ඩෙල්ෆ්ට් දූපතට ගොස් අක්කර 34 ක පමණ ඉඩමක රජයට අයත් ඉඩම් හඳුනාගෙන තිබේ. හඳුනාගත් ඉඩම් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියට පවරා ගැනීමේ අරමුණින් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය මේ වන විට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සමග කටයුතු කරමින් සිටියි.

### 2. කල්පිටියේ ප්‍රධාන භූමිය

පහත දැක්වෙන්නේ උතුරු කලාපයේ දැවැන්ත සංචාරක ව්‍යාපෘති සංවර්ධනය කිරීම සඳහා 2019 වර්ෂයේ දී ගෙන ඇති පියවරයන්ය.

- කල්පිටිය අර්ධද්වීපයේ වෙරළබඩ ඉඩම් සඳහා ආයෝජකයින් කිහිප දෙනෙකුගෙන් විමසීමක් කර ඇති අතර ඇතැම් ව්‍යාපෘති යෝජනා OCEM (ආර්ථික කළමනාකරණය පිළිබඳ නිල කමිටුව) වෙත යොමු කර ඇති හෙයින්, හඳුනාගත් ඉඩම් බදු දීම සඳහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියට පවරා දෙන ලෙස OCEM කල්පිටියේ ප්‍රාදේශීය ලේකම්වරයාට උපදෙස් දී තිබේ. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ඉඩම් බදු දීමේ ක්‍රියාවලියට අනුව ආයෝජකයින් සඳහාද එසේම ක්‍රියාත්මක ය.

- හඳුනාගත් ඉඩම් පිළිබඳව සමීක්ෂණයක් සිදු කළ නමුත් පළාත් සභාවේ නිර්දේශය අපේක්ෂා කිරීම හේතුවෙන් ක්‍රියාවලිය තවමත් සෙමින් ඉදිරියට යමින් පවතී.

## සංචාරක සංවර්ධනය සඳහා නව ඉඩම් හඳුනා ගැනීම

- අකුරල ඉඩම - ඉඩම් හඳුනාගෙන ඇති අතර ඉඩම් සමීක්ෂණ කටයුතු සිදු කිරීමට නියමිතය.
- ඉරණවිල ඉඩම - ඉඩම් හඳුනා ගැනීම සහ පවරා ගැනීමේ ක්‍රියාවලිය අඛණ්ඩව සිදු වෙමින් පවතී.
- මාබල් බීච් ලෑන්ඩ් - ඉඩම් අමාත්‍යාංශයේ සහාය ඇතිව හඳුනාගත් ඉඩම් සහ පවරා ගැනීමේ ක්‍රියාවලිය අඛණ්ඩව සිදු වෙමින් පවතී.
- වාකරේ ඉඩම - ඉඩම් හඳුනාගෙන මැනුම් කටයුතු සඳහා බාරදීමේ ක්‍රියාවලිය සිදු වෙමින් පවතී.

## සංචාරක කලාප සැලසුම් සකස් කිරීම

පහත දැක්වෙන පරිදි අදියර දෙකකින් සංචාරක සංවර්ධන කලාප හතක් සඳහා ප්‍රධාන සැලසුම් සකස් කිරීමට ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය නාගරික සංවර්ධන අධිකාරියේ (UDA) සේවය ලබා ගත්තේය.

**පළමු අදියර:** ඇල්ල, අරුගම් බේ, නුවර එළිය සහ කල්පිටිය සඳහා කලාප සැලසුම් සකස් කිරීම.

**දෙවන අදියර:** හික්කඩුව, බේරුවල සහ පින්නවල සඳහා කලාප සැලසුම් සකස් කිරීම.

**ඒ අනුව, 2019 වර්ෂය තුළ පළමු අදියර සම්බන්ධයෙන් පහත සඳහන් ප්‍රගතිය ලබා ඇත:**

- **අරුගම් බේ**

  වැඩ ආරම්භ කර ප්‍රගතියක් ලැබීය. ආරම්භක වාර්තාව මෙන්ම අතුරු වාර්තා ඉදිරිපත් කිරීම් ද සම්පූර්ණ කරන ලදී.
  අවසාන වාර්තාව සකස් කිරීම සිදු වෙමින් පවතී.

- **ඇල්ල**

  ව්‍යාපෘතිය සම්බන්ධ ආරම්භක වාර්තාව සහ අතුරු වාර්තාව ඉදිරිපත් කිරීම අවසන් කර අවසන් වාර්තාව සකස් කිරීම සිදු වෙමින් පවතී.

- **නුවර එළිය**

  ආරම්භක වාර්තා ඉදිරිපත් කිරීම අවසන් කර ඇත. අතුරු වාර්තාව ඉදිරිපත් කිරීමේ කටයුතු සිදු වෙමින් පවතී.

## 10.3 තත්ව නඩත්තුව

පුළුල් පරාසයක ගුණාත්මකභාවයක් පවත්වා ගැනීම, සෑම දෙපාර්තමේන්තුවක්ම සහ ආයතනයක්ම සෘජුව හා වක්‍රව යටතට ගැනෙන බවට සහතික වීම. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් නියමිත ප්‍රමිතීන් පවත්වා ගෙන යන අතර ප්‍රමිති සහ ගුණාත්මක ක්‍රමවේද පිළිබඳව දැනුවත්ව සිටීම සපයනු ලබන සේවාවන් සඳහා අත්‍යවශ්‍ය අංගයකි. මෙම තත්ව නඩත්තු පියවර අංශ කිහිපයක් යටතේ සිදු කෙරේ.

### (අ) ආයතන ලියාපදිංචි කිරීම

සංචාරක ආයතන සහ සේවා සපයන්නන් ලියාපදිංචි කිරීම සහ බලපත්‍ර ලබා දීම මෙම විෂය පථයට අයත් ප්‍රධාන හා වැදගත් කාර්යයකි. ආරම්භයේදීම නියමිත ප්‍රමිතීන් ක්‍රියාත්මක වනවා පමණක් නොව අඛණ්ඩව පවත්වාගෙන යනු ලබන්නේද යන්න සොයා බැලීම සඳහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය නිරන්තර පරීක්ෂාවන් සිදු කරයි.
ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි සංචාරක ආයතන ගණන පහත දැක්වේ:

## නවාතැන් අංශය

| කාණ්ඩ | ලියාපදිංචි වූ ආයතන ගණන 01.01.2019 - 31.12.2019 | | ලියාපදිංචි වූ ආයතන ගණන 31.12.2019 දක්වා | |
|---|---|---|---|---|
| | ඒකක | කාමර | ඒකක | කාමර |
| වර්ගීකරණය කළ සංචාරක හෝටල් | 9 | 720 | 144 | 13,761 |
| තරු පහේ | 1 | 141 | 25 | 5,354 |
| තරු හතරේ | 3 | 262 | 24 | 2,564 |
| තරු තුනේ | 2 | 102 | 25 | 1,558 |
| තරු දෙකේ | 3 | 215 | 36 | 2,461 |
| තරු එකේ | 0 | 0 | 34 | 1,824 |
| වර්ගීකරණය නොකරන ලද සංචාරක හෝටල් | 12 | 382 | 219 | 9,148 |
| බුටික් හෝටල් | 5 | 94 | 35 | 712 |
| බුටික් විලා | 6 | 61 | 44 | 313 |
| ගෙස්ට් හවුස් | 123 | 1,521 | 919 | 10,323 |
| සත්කාරක නිවාස | 130 | 399 | 547 | 1,668 |
| බංගලා | 75 | 268 | 460 | 1,862 |
| හෙරිටේජ් බංගලා | 0 | 0 | 4 | 19 |
| හෙරිටේජ් හෝම් | 0 | 0 | 3 | 9 |
| කුලියට ගත් මහල් නිවාස | 4 | 10 | 69 | 223 |
| කුලියට ගත් නිවාස | 0 | 0 | 5 | 14 |
| නේවාසිකාගාර | 10 | 125 | 10 | 125 |
| **එකතුව** | **374** | **3,580** | **2,459** | **38,177** |

## විශේෂිත සංචාරක සේවා

| කාණ්ඩ | ලියාපදිංචි වූ ආයතන ගණන 01.01.2019 - 31.12.2019 | ලියාපදිංචි වූ ආයතන ගණන 31.12.2019 දක්වා |
|---|---|---|
| අවන්හල් | 41 | 482 |
| සංචාරක ඒජන්සි | 85 | 989 |
| ස්පා සහ සුවතා මධ්‍යස්ථාන | 21 | 101 |
| සංචාරක සාප්පු | 11 | 87 |
| ජල ක්‍රීඩා මධ්‍යස්ථාන | 6 | 32 |
| කුළුබඩු උද්‍යාන | 2 | 39 |
| සංචාරක හිතකාමී ආහාර ගන්නා ස්ථාන | 78 | 93 |
| **එකතුව** | **244** | **1,823** |

**මාර්ගෝපදේශ සේවා**

| **මාර්ගෝපදේශ සේවාකාණ්ඩ** | **01.01.2019- 31.12.2019** | **31.12.2019 දක්වා** |
|---|---|---|
| ජාතික සංචාරක මාර්ගෝපදේශ කථිකාචාර්යවරු | 135 | 1,554 |
| ෂෝෆර් සංචාරක මාර්ගෝපදේශ කථිකාචාර්යවරු | 104 | 1,296 |
| කලාපීය සංචාරක මාර්ගෝපදේශ කථිකාචාර්යවරු | 05 | 548 |
| අඩවි සංචාරක මාර්ගෝපදේශ කථිකාචාර්යවරු | 0 | 93 |
| **එකතුව** | **244** | **3,491** |

**(ආ) එක් දින සේවාවන්**

සංචාරක කර්මාන්තයේ පාර්ශවකරුවන්ට තෘප්තිමත් සේවාවක් ලබා දීමේ අරමුණින් ප්‍රමාදයන් අවම කිරීම සඳහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය වේගවත් එක්දින සේවාවක් හඳුන්වා දෙනු ලැබිණි. මෙය 2019 අගෝස්තු 01 දින සිට බලාත්මක වීමට නියමිතය. එක්දින සේවාව මගින් පුද්ගලයින් 196 දෙනෙකුට ඔවුන්ගේ බලපත්‍ර අලුත් කර ගැනීමට පහසුකම් සලසා ඇත.

**(ඇ) විවිධ අංශ සඳහා නව මාර්ගෝපදේශ.**

ගෝලීය නව ප්‍රවණතා සමගින් අනුගත වීම සඳහා ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයට නව සේවා හා ක්‍රියාකාරකම් රාශියක් ඇතුළත් වේ. කර්මාන්තයේ අවශ්‍යතාවන්ට අනුකූල වීම සඳහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් පහත සඳහන් නව කාණ්ඩයන් ලියාපදිංචි කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා නව මාර්ගෝපදේශ හා රෙගුලාසි හඳුන්වා දෙන ලදී:

- කඳවුරු බිම්
- මහල් නිවාස
- සංචාරක කර්මාන්තයට සම්බන්ධ සංගම්

**(ඈ) මත්පැන් බලපත්‍ර**

හෝටල්, ආගන්තුක නිවාස සහ ආපනශාලා සඳහා මත්පැන් බලපත්‍ර නිකුත් කිරීම සඳහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය සුරාබදු දෙපාර්තමේන්තුවට නිර්දේශ ඉදිරිපත් කරයි.

| **කාණ්ඩ** | **නිකුත් කරන ලද බලපත්‍ර ගණන** |
|---|---|
| වර්ගීකරණය කරන ලද හෝටල් | 122 |
| වර්ගීකරණය නොකරන ලද හෝටල් | 255 |
| බුටික් හෝටල් | 24 |
| බුටික් විලා | 25 |
| ගෙස්ට් හවුස් | 575 |
| අවන්හල් | 389 |
| කඳවුරු | 03 |
| **එකතුව** | **1,393** |

**(ඉ) වර්ගීකරණය**

2019 අප්‍රේල් 20 දිනැති අංක 1693/20 දරණ විශේෂ ගැසට් නිවේදනය සියලුම සංචාරක හෝටල් අනිවාර්ය අවශ්‍යතාවයක් ලෙස වර්ගීකරණය කිරීමට නිර්දේශ කර තිබේ. අලුතින් පත් කරන ලද හෝටල් වර්ගීකරණ කමිටුව සංචාරක හෝටල් පරීක්ෂා කර මෙම වර්ගීකරණය සිදුකර ඇත:

2019 පෙබරවාරි 14 සිට 2019 ඔක්තෝබර් 15 දක්වා කාලය තුළ කරන ලද පරීක්ෂාවන් සංඛ්‍යාව

| වත්මන් තත්වය | Nos. |
|---|---|
| පරීක්ෂාවන් ගණන | 26 |
| වර්ගීකරණය කර ඇති ආකාරය | |
| තරු පහේ | 1 |
| තරු හතරේ | 4 |
| තරු තුනේ | 3 |
| තරු දෙකේ | 1 |
| තරු එකේ | - |
| නිවැරදි කළ යුතු අඩුපාඩු | 12 |
| පහත හෙලන ලද | 4 |
| බුටික් හෝටල් | 1 |

**(ඊ) පරීක්ෂාවන්**

| **කාණ්ඩ** | **සිදු කළ පරීක්ෂාවන්** |
|---|---|
| හෝටල් | 8 |
| බුටික් විලා | 4 |
| ගෙස්ට් හවුස් | 270 |
| සත්කාරක නිවාස | 50 |
| කුලියට ගත් මහල් නිවාස | 10 |
| බංගලා | 87 |
| හෙරිටේජ් බංගලා | 1 |
| නේවාසිකාගාර | 4 |
| අවන්හල් | 60 |
| සංචාරක ඒජන්සි | 90 |
| ස්පා සහ සුවතා මධ්‍යස්ථාන | 24 |
| ජල ක්‍රීඩා | 8 |
| කුළුබඩු වගා | 2 |
| සංචාරක සාප්පු | 12 |
| සංචාරක හිතකාමී ආහාර ගන්නා ස්ථාන | 13 |
| කඳවුරු | 2 |
| මහල් නිවාස හෝටල් | 1 |
| **එකතුව** | 646 |

**(උ) වීසා බලපත්‍ර සඳහා නිර්දේශ.**

සංචාරක කර්මාන්තයේ නියැලී සිටින විදේශීය කාර්ය මණ්ඩලය සඳහා නේවාසික වීසා නිකුත් කිරීම සඳහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය ආගමන හා විගමන දෙපාර්තමේන්තුවට නිර්දේශ ඉදිරිපත් කරයි.

| ආයතනය | කාණ්ඩය | ප්‍රමාණය | එකතුව |
|---|---|---|---|
| බුටික් හෝටල් | | | |
| | මෙහෙයුම් අධ්‍යක්ෂ | - | - |
| | සාමාන්‍යාධිකාරී | - | - |
| ගෙස්ට් හවුස් | | | |
| | අධ්‍යක්ෂවරු | 06 | - |
| | විශේෂ සූපවේදී (Chef) | 01 | - |
| | විශේෂ සූපවේදී (Cook) | 05 | 12 |
| හෝටල් | | | |
| | උපදේශක | 01 | - |
| | සාමාන්‍යාධිකාරී | 04 | - |
| | නේවාසික කළමනාකරු | 02 | - |
| | F & B අධ්‍යක්ෂවරුන්<br><br>කාමර අංශ කළමනාකරු | 01<br><br>02 | -<br><br>- |
| | විකුණුම් හා අලෙවිකරණ අංශ ප්‍රධානී | - | - |
| | | - | - |
| | විධායක සූපවේදී (Chef) | 01 | - |
| | විශේෂ සූපවේදී (Cook) | 21 | - |
| | විශේෂ සූපවේදී | 03 | - |
| | ඇනිමේටර් | - | - |
| | සංගීතඥ | 02 | 39 |
| ආයෝජක | | 01 | 01 |
| අවන්හල | | | |
| | උපදේශක | - | - |
| | විශේෂ සූපවේදී (Chef) | 18 | - |
| | විශේෂ සූපවේදී (Cook) | 28 | 46 |
| | ඇනිමේටර් | - | - |
| | නර්තන ශිල්පී | - | - |
| ස්පා | | - | - |
| | උපදේශක | - | - |
| | ස්පා කළමනාකරු | 06 | - |
| | ස්පා චිකිත්සක | 101 | 107 |
| ට්‍රැවල් ඒජන්සිය | | | |
| | නේවාසික නියෝජිත | 41 | - |
| | සංචාර නායකයා | 10 | - |
| | භාෂා විශේෂඥ | 41 | 92 |
| ජල ක්‍රීඩා | | | |
| | කයිට් සර්ෆින් පුහුණුකරු | 05 | 5 |
| **මුළු එකතුව** | | **300** | **302** |

(ඌ) ජංගම සේවා

සංචාරක ක්ෂේත්‍රය ආශ්‍රිත අවිධිමත් ක්‍රියාකාරකම් විධිමත් කිරීම සඳහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය ප්‍රධාන සංචාරක කලාප ඉලක්ක කර ගනිමින් ජංගම සේවා පවත්වයි. 2005 අංක 38 සංචාරක පනතට අනුව සියලුම සංචාරක නිෂ්පාදන හා සේවා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි කිරීම අනිවාර්ය වේ. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය සමග විධිමත් ලියාපදිංචිය සඳහා සැලකිය යුතු සංචාරක නිෂ්පාදන හා සේවා ප්‍රමාණයක් අන්තර්ග්‍රහණය කිරීමට ජංගම සේවා පහසුකම් සපයයි.



ජංගම සේවා

10.4 **ප්‍රවර්ධනය**

**අන්තර්ජාතික වශයෙන් හඳුනාගැනීම හා ධාරිතාවය ඉහළ නැංවීම**

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ නිලධාරීන් 26 දෙනෙකු UNWTO / PATA සහ GSTC විසින් පවත්වන ලද සම්මන්ත්‍රණ අටකට සහ UNWTO විසින් පවත්වන ලද පුහුණු දෙකකට සහභාගී වූහ. ගරු අමාත්‍යතුමා, ඔහුගේ සහායක කාර්ය මණ්ඩලය, සංචාරක අමාත්‍යාංශයේ ලේකම් සහ අතිරේක ලේකම්, අධ්‍යක්ෂ ජනරාල්, අධ්‍යක්ෂ සහ සහකාර අධයක්ෂවරුන් ඇතුළු අධිකාරිය තුළ විවිධ මට්ටමේ නායකත්වය මේ සඳහා සහභාගී විණි.

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් මෙවැනි උත්සව හා සංසදයන්ට අඛණ්ඩව සහභාගී වීම, අන්තර්ජාතික වශයෙන් හඳුනාගැනීම හේතුවෙන්, ඉකුත් වසරේ මුල සිදුවූ පාස්කු බෝම්බ ප්‍රහාරයෙන් පසු ලද අන්තර්ජාතික ප්‍රජාවන්ගේ මිත්‍රත්වය සහ සහයෝගයට හේතුවිය.

## (අ) ප්‍රකාශන

සංචාරක කර්මාන්තයට අදාළ ගුණාත්මක හා ප්‍රමාණාත්මක දත්ත පිළිබඳ සවිස්තර ප්‍රකාශන පර්යේෂණ හා ජාත්‍යන්තර සබඳතා අංශය විසින් නිතිපතා ප්‍රකාශයට පත් කරනු ලැබේ. ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයේ කාර්යසාධනානුකූලව සංචාරකයින්ගේ පැමිණීම, විදේශ විනිමය ඉපැයීම, රැකියා අවස්ථා නිර්මාණය, හෝටල්වල රැඳී සිටීමේ අනුපාත, සංචරණ රටාවන් සහ හැසිරීම්, ආකර්ෂණීය ස්ථාන, භාවිතා කළ පහසුකම් හා සේවාවන්, සංචාරකයින්ගේ වියදම්, නවාතැන් හා ඒ සඳහා වූ ආයෝජනයන්, ගුවන් ගමන් වාර ගණන හා ආසන ධාරිතාවය පිළිබඳ විස්තර උක්ත ප්‍රකාශනයෙන් දක්වයි.













## (ආ) වැඩසටහන්

### ලෝක සංචාරක දින සැමරුම්

මෙය සැමරීම සඳහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය සහ ශ්‍රී ලංකා සංචාරක ව්‍යාපාරයේ අනෙකුත් ප්‍රධාන ආයතන සමග සංචාරක සංවර්ධන වනජීවී හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශයේ මග පෙන්වීම යටතේ කොළඹ දින දෙකක විශේෂ වැඩසටහනක් සහ දිවයින පුරා තවත් උත්සව කිහිපයක් සංවිධානය කරන ලදී. ඒ **"සංචාරක කර්මාන්තය හා රැකියා: සැමට යහපත් අනාගතයක්"** තේමාවෙන් යුතුවය.

ප්‍රධාන නිල වැඩසටහන 2019 සැප්තැම්බර් 27 වන දින නිදහස් චතුරශ්‍ර ආකේඩ්හි දී පැවැත්විණි. සැමරුම්වල විශේෂ අවස්ථා අතර:

- සැප්තැම්බර් 27 - බෙන්තොට ජාතික නිවාඩු නිකේතනයේ අලුතින් අලුත්වැඩියා කරන ලද සුලංකා බංගලා, සාප්පු පෙළ සහ කාර්යාල සංකීර්ණය විවෘත කිරීම
- සැප්තැම්බර් 27 සහ 28 - කොළඹ 07 නිදහස් චතුරශ්‍ර ආකේඩ්හි දී ප්‍රදර්ශනය, රැකියා පොළ සහ ආහාර වීදිය
- සැප්තැම්බර් 27 සහ 28 - කොළඹ 07 නිදහස් චතුරශ්‍ර ආකේඩ්හි දී විනෝදාත්මක වැඩසටහන
- සැප්තැම්බර් 28 - සංචාරක නායකයින්ගේ සමුළුව සහ ජාත්‍යන්තර පර්යේෂණ සමුළුව කොළඹ 07 හි BMICH හිදී
- සැප්තැම්බර් 28 සහ 29 - අරුගම්බේහි කලාපීය ලෝක සංචාරක දින සැමරුම්.





## ජාතික තිරසාර සංචාරක සහතිකකරණය







තිරසාර සංචාරක ප්‍රමිතීන් ස්ථාපිත කිරීම සහ ලියාපදිංචි ආයතන අතර අනුකූලතාවය සහතික කිරීම සඳහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය 2017-2018 සංචාරක උපායමාර්ගික සැලැස්මේ 95 වන ක්‍රියාමාර්ගයට අනුකූලව "ජාතික තිරසාර සංචාරක සහතිකකරණය" (NSTC) දියත් කළේය.

NSTC ස්ථාපිත වූයේ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ BIOFIN හි මූල්‍ය හා තාක්ෂණික සහයෝගීතා-වයෙනි. NSTC යනු ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාර සේවා දේශීය හා ජාත්‍යන්තර වශයෙන් වඩා තරගකාරී වන පරිදි සැකසීමට තීරණාත්මක පියවරකි.

ගෝලීය තිරසර කවුන්සිලයේ (GSTC) ප්‍රධාන විධායක නිලධාරී රැන්ඩි ඩර්බන්ඩ් මහතා සහ GSTC හි ආසියා පැසිෆික් අධ්‍යක්ෂ ආචාර්ය මිහී කන්ග් සහ කර්මාන්තය නියෝජනය කරන අනෙකුත් නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් සම්මාන ප්‍රදානෝත්සවය 2019 අගෝස්තු 5 වන දින අපේ ගම පරිශ්‍රයේදී සාර්ථකව පැවැත්විණි.

හෝටල් 37 ක් ඔවුන්ගේ තිරසාර භාවිතයන් සඳහා පිළිගැනීමට ලක් වූ අතර මෙම හෝටල් ප්ලැටිනම්, රන්, රිදී සහ ලෝකඩ ලෙස වර්ග කර ඒ අනුව සම්මාන ප්‍රදානය කරන ලදී. සහභාගීත්වය සඳහාද සහතික ද ප්‍රදානය කරන ලදී. තිරසාර කළමනාකරණය, සමාජ, සංස්කෘතික හා ආර්ථික යන ප්‍රධාන අංශ හතර සඳහා විශේෂ සම්මාන පිරිනමන ලදී.

**මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණු වූයේ**

- විශ්වසනීය හා පිළිගත් ජාතික ප්‍රමිතීන් තුළින් ශ්‍රී ලංකාවේ තිරසාර සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම.
- සංචාරක කර්මාන්තයේ දීප්තිමත් අනාගතයක් සඳහා සංචාරක ව්‍යාපාරය රඳා පවතින ස්වාභාවික සංස්කෘතික හා පාරිසරික සම්පත් ආරක්ෂා කිරීම.
- සංචාරක කර්මාන්තයේ තිරසාර හොඳම භාවිතයන් අනුගමනය කිරීම පාර්ශ්වකරුවන් පෙළඹවීම.
- එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධන ඉලක්ක (SDGs) වලට අනුකූලව ශ්‍රී ලංකා සංචාරක ව්‍යාපාරය ඉහළ මට්ටමකට ගෙන යාම.
- තිරසාර බව කෙරෙහි අවධානය යොමු කරන සංචාරකයින් ආකර්ෂණය කර ගැනීම සඳහා නව තරගකාරී ප්‍රතිලාභ ළඟා කර දීම.

සංචාරක කර්මාන්තය අරමුණු කරගනිමින් කෙරෙන කඩිනම් සංවර්ධනයන් හේතුවෙන්, පරිසරයට සිදුවන බලපෑම අතිමහත්ය. පරිසර හිතකාමී ගමනාන්තයක් නිර්මාණය කිරීමේ අරමුණින්, ජාතික තිරසාර සංචාරක සහතිකය ප්‍රදානය කිරීමට සමගාමීව, කර්මාන්තයේ පාර්ශවකරුවන්ගේ සහභාගීත්වයෙන්, ගස් සිටුවීමේ ව්‍යාපාරයක්ද අගෝස්තු 5 වන දින පවත්වන ලදී.




## 10.5 දැනුවත් කිරීමේ පුහුණුව

විදේශීය හා දේශීය සංචාරකයින්ගේ අවශ්‍යතා සපුරාලීම සඳහා දිවයින පුරා සංචාරක නිෂ්පාදන හා සේවාවන්හි ගුණාත්මකභාවය ඉහළ නැංවීමේ අවශ්‍යතාවය ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් හඳුනාගෙන තිබේ. එබැවින්, නවාතැන්, ආගන්තුක නිවාස, බංගලා, අවන්හල් සහ සංචාරක හිතකාමී ආහාර ගන්නා ස්ථාන වැනි සංචාරක නිෂ්පාදන හා සේවාවන්හි දැනුම හා ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සඳහා අධිකාරිය විශේෂ දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී. 2019 දී ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් විවිධ ස්ථානවල දැනුවත් කිරීමේ වැඩසටහන් 9 ක් ආරම්භ කරන ලදී.




## 10.6 දේශීය සංචරණ හා ප්‍රජා සම්බන්ධතා

**පළාත් සභා තුළ අප්‍රසිද්ධ ආකර්ශන සහ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.**

### අළුත්නුවර සංචාරක පහසුකම් මධ්‍යස්ථානය

අළුත්නුවර දේවාලය යනු කොළඹ - මහනුවර මාර්ගයේ මාවනැල්ලට ආසන්නව පිහිටි කෑගල්ලේ පිහිටි ප්‍රසිද්ධ ආගමික ගමනාන්තයකි. නරඹන්නන්ගෙන් බහුතරයක් දේශීය සංචාරකයින් වන අතර, දේවාලය සහ වාර්ෂික පෙරහැර ආකර්ෂණීය අංග වේ. සබරගමුව පළාත් සභාව විසින් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ (රුපියල් මිලියන 17.05) අරමුදලින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ අතර ව්‍යාපෘතියෙන් 70% ක් සම්පූර්ණ කරන ලදී.





### රජනෑව ඇල්ල සංවර්ධනය

කලවාන පාරට මායිම්ව පිහිටි රත්නපුර දිස්ත්‍රික්කයේ, සබරගමුව පළාතේ වඩාත් ජනප්‍රිය දියඇල්ලකි රජනෑව ඇල්ල. එය දේශීය හා ජාත්‍යන්තර සංචාරකයින් අතර නැගී එන සංචාරක ආකර්ෂණය දිනූ ස්ථානයකි. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය ඉහත සංවර්ධන ව්‍යාපෘතියෙන් 80% ක් සබරගමුව පළාත් සභාව සමඟ අත්වැල් බැඳගෙන රුපියල් මිලියනයක වියදමින් සම්පූර්ණ කර ඇති අතර මෙම ව්‍යාපෘතිය 2020 පළමු කාර්තුව තුළ අවසන් කිරීමට නියමිතය.





### කුළුබඩු අලෙවිකරණ මධ්‍යස්ථානය

දේශීයව නිපදවන කුළුබඩු මිලදී ගැනීම සංචාරකයින් අතර ඉතා ජනප්‍රිය වේ. ඔවුන්ගේ ගමනේදී කුළුබඩු මිලදී ගැනීම පහසු කිරීම සඳහා මධ්‍යම පළාත විසින් අලෙවිසැල් සහිත කුළුබඩු උද්‍යානය මාතලේ, පිහිටුවන ලදී. මෙම ව්‍යාපෘතිය සඳහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය මිලියන 7 ක් වැය කර ඇත.




### දැනට පළාත් සභාව සමඟ සිදුවෙමින් පවතින ව්‍යාපෘති

### දුන්හිඳ සංවර්ධනය

ඌව පළාත් සභාවේ සහාය ඇතිව දුන්හිඳ වෙත ඇවිද යන මාර්ගයේ හස්ත කර්මාන්ත කුටි සංවර්ධනය කිරීම සඳහා මෙම ව්‍යාපෘතිය ආරම්භ කර ඇත. ව්‍යාපෘතියෙන් 30% ක් පමණ අවසන් කර ඇති අතර එය 2020 දී ද ක්‍රියාත්මක වේ.




### ගැටබරුව සංචාරක පහසුකම් මධ්‍යස්ථානය

ගැටබරුව යනු දකුණු පළාතේ වඩාත් ප්‍රසිද්ධ පන්සල සහ දේවාලය වේ. නරඹන්නන්ගේ සංඛ්‍යාව සැලකිල්ලට ගනිමින් නරඹන්නන්ගේ පහසුකම් මධ්‍යස්ථානය 2019 දී දකුණු පළාත් සභාව සමඟ ආරම්භ කරන ලදී. මුල්ගල් තැබීමත් සමඟ ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී. ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 100.0 කි.



**කළුදිය පොකුණ සහ පිදුරංගල සංවර්ධන ව්‍යාපෘතිය**

2018 වන විට සීගිරිය ජනාකීර්ණ ආකර්ෂණය දිනාගත් ස්ථානයක් බවට පත්ව තිබුණි. අසල්වැසි ආකර්ශනීය ස්ථාන දෙක අතර අමුත්තන්ගේ පැමිණීම වඩා හොඳින් බෙදා හැරීම සඳහා ඉහත සංවර්ධන ව්‍යාපෘති දෙක සඳහා රුපියල් මිලියන 0.5 ක් මධ්‍යම සංස්කෘතික අරමුදලට මුදා හරින ලදි.

**සංචාරක පොලිසියට සහාය වීම**

- මිරිස්ස ප්‍රවේශයේ පිහිටි තෝරාගත් ස්ථානයක සංචාරක පොලිස් ස්ථානය ඉදිකිරීම සඳහා රු. මිලියන 5.3 ක් වෙන් කරන ලදී.
- පැමිණිලි සහ සංචාරක හිංසනයන් සඳහා සංචාරක පොලීසියට පහසුකම් සැපයීම සදහා වියදම රු. 269,985 කි.
- සංචාරක පොලීසියේ භාවිතය සඳහා රු. මිලියන 1.09 ක වියදමින් යතුරුපැදි තුනක් ලබාදෙන ලදී.

10.7 **නිකේතන කළමනාකරණය**

මෙම අංශයේ ප්‍රධාන පරමාර්ථය වනුයේ කතරගම, අනුරාධපුර, නුවර එළිය සහ බණ්ඩාරවෙල යන වෙළඳ නිකේතන 04 ක් කළමනාකරණය කිරීම සහ බෙන්තොට සහ පාසිකුඩා යන වාණිජ නොවන සංචාරක නිකේතන 02 හි පිහිටි හෝටල් සඳහා ආධාරක සේවා සැපයීමයි. මීට අමතරව, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය මීට පෙර රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය විසින් පවත්වාගෙන යනු ලැබූ තනායම් 37 ක් සතුව ඇති අතර ඒවා පෞද්ගලික අංශයේ මෙහෙයුම්කරුවන්ට බදු දී ඇත.

**වෙළඳ නිකේතන.**

අමුත්තන්ගේ ඉහළ තෘප්තිමත්භාවයක් හා අපේක්ෂාවන් සපුරාලීම වෙනුවෙන් ගුණාත්මක හා සේවා ප්‍රමිතීන් වැඩි දියුණු කිරීමට සියළුම වෙළෙඳ නිකේතන නවීකරණය හා යාවත්කාලීන කරන ලදී.

**ජාතික නිවාඩු නිකේතනය - අනුරාධපුර**



ඉතා අනර්ඝ කාමර 16 ක් සහිත නව නවාතැන් පහසුකම් ඉදිකිරීම.:

කාමර 16 කින් යුත් නව නවාතැන් සංකීර්ණයක් රු. මිලියන 65 ක් වියදමින් නිම කර ගරු. සංචාරක අමාත්‍යවරයා විසින් 2019 මැයි 27 දින විවෘත කෙරිණි. කාමර 23 ක් සහ කොරිඩෝව ප්‍රතිසංස්කරණය කිරීම 2019 අප්‍රේල් මාසයේ දී රු. මිලියන 24.9 ක වියදමින් සිදු කෙරිණි. කාමර 05 ක් සඳහා මලාපවහන හා අප ජල බැහැර කිරීමේ මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම රු. මිලියන 0.65 ක වියදමින් 2019 අප්‍රේල් මාසයේ දී සිදු කෙරිණි.

### ජාතික නිවාඩු නිකේතනය - කතරගම

සම්පූර්ණ අවන්හලම නවීකරණය කරන ලද අතර දැව සිවිලිමක් සහ වායුසමීකරණයක් එක් කිරීමද සිදු කෙරිණි. ඒ සඳහා රු මිලියන 3.87 වැය විණි.

### ජාතික නිවාඩු නිකේතනය - නුවර එළිය

වර්ග අඩි 400 ක බිමක රෙදි සෝදන කාමරයක් ඉදි කිරීම.

### ජාතික නිවාඩු නිකේතනය - බණ්ඩාරවෙල.

නිවාඩු නිකේතනයේ භූමි අලංකරණය අවසන් කරන ලදී.

### ජාතික නිවාඩු නිකේතනය - බෙන්තොට

දැනට පවතින ගොඩනැගිල්ල කඩා බිඳ දමා යළි ප්‍රතිසංස්කරණය කෙරිණි. එම ප්‍රතිසංස්කරණයට සාප්පු සංකීර්ණය, අවන්හල් සහ කාර්යාල වැනි පහසුකම් ඇතුළත් වූ අතර, මේ සියල්ල මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශයේ (CECB), උපදේශනය යටතේ DNS කන්ස්ට්‍රක්ෂන් ලිමිටඩ් විසින් ඉදිකරන ලද්දකි. ගොඩනැගිල්ල සහ එහි පහසුකම් සඳහා සමස්ත පිරිවැය රු. මිලියන 73.4 කි. ඉදි කිරීමෙන් අනතුරුව, ගරු සංචාරක අමාත්‍යවරයා විසින් 2019 සැප්තැම්බර් 27 වන දින එය විවෘත කෙරුණු අතර, සාප්පු පරිශ්‍රය, ප්‍රදර්ශන භූමිය සහ අවන්හල් ප්‍රදේශ නුදුරු අනාගතයේදී බදු දීමට නියමිතය.

අලුත්වැඩියා කිරීම් අතරතුර






වැඩ අවසන් වූ පසු







**සුලංකා බංගලාව**

සුලංකා බංගලාව අලුත්වැඩියා කිරීමට රු. මිලියන 26.2 ක් වැය වූ අතර ගරු. සංචාරක අමාත්‍යවරයා විසින් 2019 සැප්තැම්බර් 27 වන දින බංගලාව අමුත්තන් සඳහා විවෘත කරන ලදී.





විනෝදාශ් වාදය ලබා ගැනීම සඳහා වූ ප්‍රදේශයක් ලෙස බෙන්තොට ආදර්ශ වෙරළ තීරය හඳුනා ගෙන ඇති අතර එය රු. මිලියන 100 ක වියදමකින් සංවර්ධනය කොට 2020 අප්‍රියල් මස අවසන් කිරීමට නියමිතය. තව ද ජල ප්‍රවර්ධන ජාලයක් (පවිත්‍රකරණයක් සමඟ), පිරිසිදු කිරීමේ ස්ථානයක් මෙන්ම ස්වාභාවික පොකුණු පිරිසිදු කිරීම් හා පුනරුත්ථාපනය කිරීම, කෘතිම පොකුණු නවීකරණය, නිවාඩු නිකේතන නිලධාරීන්ගේ බංගලා අලුත්වැඩියා කිරීම, කාර්ය මණ්ඩලයේ නිල නිවාස, සංචාරක පොලිස් ස්ථානය, දුම්රිය ස්ථානය, තැපැල් කාර්යාල ගොඩනැගිල්ල, වීදි සහිත අභ්‍යන්තර මාර්ග ජාලය ඇතුළු සමස්ත ජල සැපයුම් ජාලයක් සංවර්ධනය කිරීම ඊට අයත්ය. මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශයේ (CECB) උපදේශනය යටතේ මුළු නිවාඩු නිකේතනයේම විදුලි පහන් භූමි අලංකරණය සිදු වෙමින් පවතී.

**ජාතික නිවාඩු නිකේතනය - පාසිකුඩා**

වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුව විසින් එහි ජීවිතාරක්ෂක ඒකකය ඉදිකිරීම අවසන් කර මේ වන විටත් ක්‍රියාත්මක වේ. ජල පොම්ප, පොම්පාගාරයක් සහ ආරක්ෂක කුටිවල ඉදිකිරීම් කටයුතු සඳහා රු. මිලියන 22 කි.

**තානායම්**

රාජ්‍ය පරිපාලන අමාත්‍යංශය මඟින් කළමනාකරණය වූ තානායම් 37ක් දේශීය සංචාරකයින්ට පහසුකම් සැලසීමට සහ එහි කළමනාකාරීත්වය සඳහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය වෙත භාර දෙන ලදී.

ඒ අනුව, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය රජයේ තක්සේරුකරුගේ නිර්දේශය පරිදි කල්බදු කුලියක් එකතු කර කළමනාකරණය කර ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කරමින් පෞද්ගලික ලංසුකරුවන් හට එම තානායම් බදු දෙනු ලැබිණි.

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය මහව, නිකවැරටිය, වීරකැටිය, හොරොව්පතාන, මහියංගනය, බත්තලුඔය, රාගල සහ බිබිල යන ස්ථානවල තානායම් ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා බදු දී තිබේ. තානායම් 3ක ප්‍රතිසංස්කරණ කටයුතු අවසන් කිරීමෙන් පසු මෙහෙයුම් මට්ටමට ගත හැක.

10.8 **මෙහෙයුම් සහ උපකාරක සේවා**

**(අ) තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය**

